ක්‍රිස්තුස් වහන්සේගේ

# පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"පොළොවෙහි කරුණාවත්, විනිශ්චයත්, ධර්මිෂ්ටකමක් පවත්වන ස්වාමින් වහන්සේ මමයයි තේරුම්ගෙන මා දැනගැනීම නම් වූ කාරණය ගැනම පාරට්ටු කර ගනීවා." (යෙරමියා 9 : 24)

76 වන වෙළුම 02 (902) 2017 පෙබරවාරි

# ශුද්ධකම දැනගැනීම

(ඒ. ඩබ්. ටෝසර් විසිනි)

වරෙක දෙවියන් වහන්සේගේ උසස් වූ සංකල්ප වලට (අදහස්වලට) යටත්ව සිටියාවූ උන්වහන්සේගේ සභාව ඒ වෙනුවට පහත නීච සම්පූර්ණයෙන්ම නුසුදුසු මනුෂ්‍යය සිතුවිලි වලට ගොදුරු වී මනුෂ්‍යයාට නමස්කාර කිරීමට යොමු වී ඇත. එම නිසා දෙවියන් වහන්ස්ගේ සභාව පරික්ෂාකාරී නොවී ක්‍රම ක්‍රමයෙන් දැනගැන්ම අහිමි වී ගිය තත්වයකට පත්වූවෝය. එබැවින් සභාවේ තත්වය නොදනුවත්කමේ මහත් බේදවාචයකට හසුවූවාය.

අප අතරේ සෑම තැනම පවතින සිය ගණන් නපුරු කාරණා හේතුවෙන් පොදුවේ කිතුණුවන් අතරේ දෙවියන් වහන්සේට ඇහුම්කන් දීමට, දෙවියන් වහන්සේගේ ස්වභාවය ඇතිව ජීවත් වීමට සැලකිල්ල දැක්වීම සම්පූර්ණයෙන්ම බෙලහීන වී තිබේ. අපගේ ආගමික සිතුම් පැතුම් වැරදි පදනමක් මත පැවතීමේ ප්‍රතිඵලය හේතුවෙන් කිතුණු ජීවිතය සම්පූර්ණයෙන්ම නුසුදුසු වූ අළුත් දර්ශනයක් තුල ගමන් කරමින් පවතින්නේය.

දිව්‍යමය අභිමුඛත්වය සහ තේජස පැමිණ අපව ප්‍රබෝධමත් කිරීමේ හැඟීම අහිමිවී ගොස් තිබේ. ආත්මයෙන් නමස්කාර කිරීමෙන් මුලාව ගොස් තිබේ. ආත්මයන් නමස්කාර කිරීමෙන් මුලාව ගොස් සහ නිශ්චලව සිට අපගේ ඇතුලාන්තයෙන් දෙවියන් වහන්සේව මුණ ගැසීමේ හැකියාව නොමැති වී සිටින නිසා දෙවියන් වහන්සේට ඇති දැඩි ආදරය, භක්තිය නැති වී ගොස් ඇත. පොදු වේ වර්තමාන කිතුණුවන් තුල කිතුණු ආත්මික ජීවිතයේ වටිනාකම සහ අත්දැකීම් ගති ලක්ෂණ ලෙස ප්‍රකාශ නොවේ. දේව වචනයේ මෙලෙස සදහන්ව තිබේ.

**"නිශ්චලව මා දෙවියන් වහන්සේ බව දැනගනිව්..."**

(ගීතාවලිය 46 : 10) එයින් ඊළගට පෙන්වා දෙන්නේ ආත්ම විශ්වාසයක් නැති කඩිමුඩියෙන් නමස්කාර කරන්නන් වී සිටින බවයි.

ආත්මිකව පිරිහීමේ පාඩුව හරිගස්වා ගැනීමේ එකම මාර්ගය වන්නේ තමන්ගේ කාරණාවලින් සැබෑ ලෙස ලබාදෙන්නා වූ තැනන් වහන්සේ වෙතට හැරී ඇවිත් හරිගැස්සිම පමණි. අපගේ ප්‍රශ්ණ වැඩි දියුණු වී තිබෙන්නේ ශුද්ධකමේ දැනගැන්ම අහිමි වී තිබෙන නිසාය. තමාගේම පිළියම් සෙවීමේ මාර්ගවල ගමන් නොකර දෙවියන් වහන්සේගේ තේජස සෙවිය යුතුය. යහපත් යැයි හැගෙන අපගේම ක්‍රියාවල පැවතීමෙන් එය කල නොහැකිය. අපගේ ඇතුලාන්ත ආකල්ප නිවැරදි කරගන්නා අතරම දෙවියන් වහන්සේ පිළිබදව ඇති අපගේ වැරදි අදහස් හෝ නුසුදුසු අදහස් හරිගස්වා ගත යුතුය. අපගේ ජීවිතවලට නැවත ආත්මික බලය ලබා ගැනීමට දෙවියන් වහන්සේට ඉතා සමීපවීමට ආරම්භ කල යුතුය.

## අපි දෙවියන් වහන්සේ පිළිබඳව නිවැරදිව සිතිය යුත්තේ ඇයි....?

දෙවියන් වහන්සේව අපට අත්‍යවශ්‍යය බව සිතනවිට අපගේ කල්පනාවට හැගෙන්නේ කුමක්ද....? මනුෂ්‍යය වර්ගයාගේ ඉතිහාසය තුල පෙනෙන අන්දමට දේව භක්තියට ඉහළින් මනුෂ්‍යයන් උසස් නොවූ බව පෙනේනේය. එමෙන්ම මනුෂ්‍යයාගේ ආත්මික ඉතිහාසය තුල ආගමික විශ්වාසය වුවත් දෙවියන් වහන්සේගේ අදහසට වඩා බලවත්ව නොතිබූ බව ස්ථිර ලෙසම ප්‍රකාශ වී තිබේ. මනුෂ්‍යයා පවිත්‍රව නමස්කාර කිරීම හෝ නමස්කාර කරන්නේකුගේ සිතෙහි ඇතිවන උසස්වූ ශක්තිය හෝ නොමැතිව දෙවියන් වහන්සේගේ සිතුවිල් වලින් පහතට වැටී ඇත.

මේ හේතුවෙන් දෙවියන් වහන්සේගේ සභාව උන්වහන්සේ ඉදිරියේ සෑමවිටම සිටීම. බරපතල ප්‍රශ්ණයක් වී ඇත. දෙවියන් වහන්සේ ඉතා මහත් වූ, අපූර්වවූ කාරණා පිළිබදව කිසිදු මනුෂ්‍යයෙකුට කාලය වැයකර කිසිවක් පැවසීමට හෝ කිරීමට නොහැකිය. නමුත් ඔහුගේ හදවතේ ඇතුලාන්තයේ තිබෙන්නාවූ දෙවියන් වහන්සේගේ කාරණා වලින් දෙවියන් වහන්සේගේ ස්වභාවය ඔහු තුල ඇතිවීමට පටන්ගන්නේය.

අපගේ මාංශයේ රහසිගත නියෝගවලට අපි නැඹුරුවීම කරුණු කොටගෙන හැසිරීම වෙනුවට දෙවියන් වහන්සේගේ සිතේ ආකාරයට ක්‍රියා කරමු. මෙය පුද්ගලිකව කිතුණුවා තුල පමණක් නොව කිතුණු සමූහය එක්ව සෑදෙන්නාවූ සභාව තුලත් සැබවිය යුතුය. දෙවියන් වහන්සේගේ අදහස සභාවේ කාරණා වලින් වඩ වඩා අනාවරණය විය යුතුය. සභාවක් ලෙස අපට ඇති ඉතා වැදගත් වූ පණිවිඩය නම් දෙවියන් වහන්සේ පිළිබඳව සභාව පවසන දේ හෝ ජීවිතවලින් හෝ ප්‍රකාශ නොවූයේ මොනවාද කියාවේ. සභාව කථාකරන දේට වඩා නිශ්චලව සිටීමෙන් බොහෝ කාරණා ප්‍රකාශ වන්නේය. තමාවම යටපත්කර නොගෙන, සහ දෙවියන් වහන්සේගේ සාක්ෂිකාරයෙක් වීමෙන් බැහැරව සිටීමට සභාවට නුපුළුවන. ඔබ දෙවියන් වහන්සේ ගැන සිතන විට ඔබගේ මනස තුලට පැමිණෙන්නේ මොනවාද....? යන ප්‍රශ්ණයට සම්පූර්ණ පිළිතුර උපුටා දැක්විය හැකි මනුෂ්‍යයෙකුව කොතැනකදී හෝ අපට සොයාගත හැකිනම් ඒ මනුෂ්‍යයාගේ ආත්මික අනාගතය පිළිබඳව අපට නිශ්චිතවම පුරෝකතනය කල හැකිය. වර්තමානයේ අපට මහත් බලපෑමක් ඇතිකල හැකි දෙවියන් වහන්සේ විසින් තෝරා පත්කල ආත්මික නායකයන් ගැන නිශ්චිතවම අපි අවබෝධ කරගත යුතුය. එවිට හෙට දවසේ සභාවේ තත්වය පිළිබඳව නිවැරදිව කලින් ප්‍රකාශ කිරීමට අපට හැකිවනු ඇත.

දෙවියන් වහන්ස්ගේ සිතේ තිබෙන්නාවූ අදහස යම් කෙනෙකු තුල තිබෙන විට සැකයක් නොමැතිව ඔහුගේ මනසේ තිබෙන කල්පනාව ඉතා බලවත්ව තිබේ. එවැනි කෙනකුගේ වචන දෙවියන් වහන්සේ උදෙසා ඕනෑම භෂාවකින් වැදගත්වූ බලපෑමකින් යුක්ත වන්නේය. එමෙන්ම දෙවියන් වහන්සේගේ ස්වභාවය තුල යටහත්කමේ දීමනාව ඇතිව සිතීමට සහ කථා කිරීමට ඔහුව ගොඩ නගන සේක. දෙවියන් වහන්සේ සමග සමීප සම්බන්ධතාවයක් නොමැතිව සහ උන්වහන්සේගෙන් වෙන්ව එය ලබාගත නොහැකිය. වාක්‍යාණෝ ගැන ප්‍රකාශ කරන්නාවූ පළමුවන වචනය ඉතා වැදගත්ව තිබේ.

***"පටන් ගැන්මේදී වාක්‍යාණෝ සිටි සේක. වාක්‍යාණෝ දෙවියන් වහන්සේ හා සමග සිටි සේක. වාක්‍යාණෝ දෙවියන් වහන්සේව සිටි සේක."***

(යොහාන් 1 : 1 ) දේව වචනය තුල තිබෙන දෙයින් දෙවියන් වහන්සේව වෙන්කල නොහැකිය. එමනිසා දෙවියන් වහන්සේ කථාකර තිබෙන දේ අපි කථාකල යුතුය.

එවිට අපගේ අදහස් දෙවියන් වහන්සේගේ ස්වාභාවයට ඉතා සමීපවන ලෙස සමානවීම අපට අසීමිත ලෙස වැදගත් වන්නේ ය. දෙවියන් වහන්සේ පිළිබඳව අපගේ සැබෑ සිතුවිලි සඳා බැලීමත් සමග එහි ප්‍රතිඵලය වශයෙන් අපගේ චර්යා රටාවන් ප්‍රකාශ වන්නේ සුළු වශයෙනි. ජාතීන්ගේ වැදගැම්මකට නැති ආගමික සම්ප්‍රදයන් දෙවියන් වහන්සේ වළලා දමනු ඇතැයි අපගේ සැබෑ අදහස වන්නේය.එමෙන්ම බුද්ධිමත්ව එය අපේක්ෂා කරන අතර එය සෝදිසි කිරීමට

2 පිටුවට

1 පිටුවෙන්

# ශුද්ධකම දැනගැනීම....

පෙර එහි සැබෑ තත්ත්වය සහ අවසානය අණාවරණය කරගනු ලබන්නේ ය.

බිහිසුණු වේදනාකාරි අත්දැකිම් වලින් පසුව තමන්වම සියුම් ලෙස සෝදිසි කරගැනීමෙන් පමණක් සමහර විට දෙවියන් වහන්සේ පිළිබඳව සැබෑ විශ්වාසය කුමක් දැයි අපට සොයාගැනීමට හැකි වන්නේය.

ක්‍රමානුකූලව දේව ධර්මයේ මූලික සත්‍යය තාවයෙන් පමණක් නොව ඊට අමතරව කිතුණු ජීවිතයේ ප්‍රායෝගික අත්දැකීම් වලිනුත් දෙවියන් වහන්සේ පිළිබඳව නිවැරදි ලෙස අවබෝධ කරගත යුතුය. දේව මාළිගාවේ නමස්කාරයට දී තිබුණනා වූ පදනම යම් අවස්ථාවක ප්‍රමාණවත් නොවූ හෝ මුළු සැලැස්මට පිටස්තරයෙන් පැවතියේ නම් ඉක්මතින් හෝ පසුව ගොඩනැගිල්ල කඩා වැටුණේය. දේවධර්ම යන්තමින් හෝ අතපසු කිරීම තුල සහ කිතුණු
ආචාරධර්ම එකතු කිරීමට නොහැකි වීම අනාවරණය කරගැනීමෙන් අවසානයේ දී දෙවියන් වහන්සේ පිළිබඳව අසම්පූර්ණ සහ නුසුදුසු සිතුවිලි හටගන්නා බව පෙනෙන්නේය.

## දෙවියන් වහන්සේ පිළිබඳව වඩා වැඩියෙන් අවබෝධ කර ගැනීම

දෙවියන් වහන්සේ පිළිබඳව කිතුණුවන්ගේ අවබෝධය පිරිහී තිබෙන නිසා ඉතා උසස්වූ දෙවියන් වහන්සේගේ ගෞරවයට සම්පූර්ණයෙන්ම නුසුදුසු සහ සැබැවින්ම ඇදහිලිවන්තයාගේ එත්තු ගැනීම තුල සමහර විශාල වූ සදාචාර ව්‍යසනයන් ඇතිවී තිබෙනවා යැයි මම විශ්වාස කරමි.

ස්වර්ගයේ සහ පොළොවේ ගැටළු වලට අපි සමාන්‍ය සමාජයේ මනුෂ්‍යයන් හා එක්ව මුහුණ දුන්නත් දෙවියන් වහන්සේගෙන් වහාම පැමිණෙන විපත්තිය සසදා ජය ගැනීමට නොහැකි වේ. දෙවියන් වහන්සේ කැමැති කුමකටද සහ අපගේ සදචාර පැවැත්ම පිළිබඳව උන්වහන්සේට අවශ්‍ය කරන්නේ කුමක්දැයි අපි අවබෝධ කරගත යුතුය.

යම් මනුෂ්‍යයෙක් දෙවියන් වහන්සේ පිළිබඳව නිවැරදි විශ්වාසයට පැමිණෙන විට බොහෝ කාලයක් තිස්සේ ඔහුට සැලකිල්ලක් දැක්වීමට නොහැකි වී තිබූ දහස් ගණන් ලෞකික ප්‍රශ්න වලට විසඳුම ලැබෙනවා ඔහු දකින්නේ ය. එසේ වුවත් විවිධ වූ කරදර ඔහු තුල වර්ධනය වන්නේ නම් එකකට පසුව එකක් ලෙස ලෝකයෙන් පැමිණෙන්නාවූ ඉතා දරුණු ව්‍යසනයන්ගේ බර සමඟ සදකාලික පැවැත්මේ පුද්ගලික වගකීම් පහතට ඇද වැටිය හැකිය. දෙවියන්වහන්සේට බැඳී සිටීමෙන් එම කරදරවලින් ජය ගැනීමට පුළුවන. එවිට ඒ මොහොතේ සිට මනස සහ සිත ශක්තිමත්ව තබා ගෙන ජීවිතාන්තය දක්වා දෙවියන් වහන්සේට ප්‍රේම කරමින්, සම්පූර්ණ ලෙස උන් වහන්සේට කීකරු වෙමින් උන්වහන්සේ අපේක්ෂා කරන ආකාරයෙන් නමස්කාර කල හැකිය. මනුෂ්‍යයාට තමාගේම වෙහෙස වීමෙන් (ශක්තියෙන්) මෙම කාරණා කල නොහැකි බවඔහුට ඔහුගේම හෘදය සාක්ෂිය පවසනු ලබන්නේ ය. නමුත් ස්වර්ගීය ආධිපත්‍යයට විරුද්ධව කුඩා කාලයේ පටන් කැරළි ගැසීමේ අප්‍රසන්න වූ වරද පිළිබඳව දෝෂාරෝපනය මනුෂ්‍යයා තුල පවතින්නේ ය. එබැවින් ඇතුලාන්තයේ පීඩාකාරී ලෙස තමාට ම චෝදනා කරගැනීමේ මහත් වූ බර දරාගෙන සිටිති.
අළු වෙනුවට අලංකාරයත්, වේදනාවේ ආත්මය වෙනුවට ප්‍රශංසාවේ වස්ත්‍රත් ලබා දී මනසේ විනාශකාරී ස්වභාවයෙන් ගළවා ගැනීමට සුභාරංචිය ට පුළුවන. සුභාරංචිය නොමැතිව වේදනාවේ බරෙන් නිදහස් වීමට මානුෂ්‍යාට නුපුළුවන. උසස් වූ දෙවියන් වහන්සේ ගැන පුද්ගලයෙකුට අවබෝධ වනතෙක් සහ උන්වහන්සේ ඔහුව ඔසවන තෙක් විපත්තියෙන් සහ වේදනාවෙන් නිදහස් වීමට ඔහුට නුපුළුවන. ඔවුන් තුල තිබෙන්නා වූ බෙලහීන සියළු දේ සුභාරංචිය කරුණු කොට ගෙන පහකර දමන සේක.

## රූප නමස්කාරයේ පාපය

අනෙකුත් පාපවලට වඩා වැඩියෙන් රූප නමස්කාරය තුලින් දෙවියන් වහන්සේව වේදනාවට පත් කිරීමට මනුෂ්‍යයාගේ හදවත් නැඹුරුවී දෙවියන් වහන්සේගේ චරිතයට අපහාස කිරීමට රූප නමස්කාරයේ ගැඹුරින්ම යෙදී සිටිති. අනිත් කාරණා වලට වඩා වැඩියෙන් රූප නමස්කාරය හදවත් අල්ලා ගන්නේය. සැබෑ දෙවියන් වහන්සේ වෙනුවට තමන්ගේම කැමැත්ත පරිදි ආදේශකයන් නිර්මාණය කර ගැනීමෙන් රූප නමස්කාරය තුල පාපය අද්භූත ලෙස පවතින්නේ ය. මේ නිසා මැවුම්කරුවාණන් කවුද කියා දෙවියන් වහන්සේ නිතරම තහවුරු කරනසේක. එමෙන්ම පවිත්‍රව සහ අත්තිවාරමව සිටින්නේ කවුද කියාත්, දයාවන්තව සිටින්නේ කවුද කියාත්, මනසේ තිබෙන්නා වූ සදාචාර ස්වාභාවය අනුව ප්‍රකාශයට පත්වන්නේ කවුද කියාත් තහවුරු කරගෙන තිබෙන සේක.

සැබෑ වූ දෙවියන් වහන්සේ මෙන් සැබෑනොවූ සම්පූර්ණයෙන්ම ස්වාභාවික වූ දෙවිවරුන්ගේ සෙවනැලි බිඳ වැටුණා වූ හදවත්වලින් පෙනෙන්නට තිබේ. ගීතිකාකරුවා තුලින් දුෂ්ඨ මනුෂ්‍යයා පිළිබඳව ස්වාමීන් වහන්සේ මෙසේ පවසා තිබෙන සේක.

**"මේවා තෝ කෙළෙහිය මමද නිශ්ශබ්දව සිටියෙමි. මමත් සියළු ආකාරයෙන් තට සමානයයි සිතුයෙහිය. එහෙත් තට තරවටු කරන්නෙමි. තාගේ ඇස් හමුයෙහි ඒවා පිළිවෙලින් තබන්නෙමියි කියන සේක."** (ගීතාවලිය 50 ඃ 21) ඉතා උසස් වූ දෙවියන් වහන්සේගේ අභිමුඛයේ සිටින්නාවූ සෙරාප්වරු නොකඩවා මොරගසමින්

**"........සේනාවල ස්වාමීන් වහන්සේ ශුද්ධය..., ශුද්ධය...ශුද්ධය...මුළු පොළොව උන්වහන්සේගේ තේජසින් පිරී තිබේයයී කීවෝය."** (යෙසායා 6 ඃ 3) ක්‍රියා යෙසායා අනාගතවකතෘ සඳහන් කර තිබේ.

ජාතීන්ගේ පාපිෂ්ඨ වූ රූප නමස්කාරය ඉදිරියේ දණින් වැටී දැඩි භක්තිය ප්‍රකාශ කිරීම සහිත ක්‍රියාවන් සහ මනුෂ්‍යයන්ව ප්‍රබුද්ධ කර තිබෙන්නා වූ රූප නමස්කාරයෙන් අප නිදහස් වී සිටීම ගැන උඩුඟුකම අප තුල ඇති නොවීමට ප්‍රවේශම් විය යුතුය. රූප නමස්කාරයේ ස්වභාවය වන්නේ දෙවියන් වහන්සේගේ අදහස් විනෝදයට ගෙන උන්වහන්සේට අවමාන කිරීමයි. එය මනසේ ආරම්භ වී සමහර විට නමස්කාරයේ ක්‍රියාවලින් ප්‍රකාශ වේ. පාවුල්තුමා මෙසේ ලියා යැව්වේය

**"මක්නිසාද ඔහු දෙවියන් වහන්සේ හැඳින ගෙන උන්වහන්සේට දෙවියන් වහන්සේට මෙන් ගෞරවයක් ස්තුතිය වත් නො කොට තමන්ගේ විතර්ක වලින් නිරර්ථක බවට පැමිණියෝය ඔවුන්ගේ අඥාන සිත්ද අඳුරු විය"**
(රෝම 1 ඃ 21)

ඊළඟට රූප නමස්කාර කරන්නන් මනුෂ්‍යයන්ගේ, කුරුල්ලන්ගේ, මෘගයන්ගේ සහ බඩගා යන සතුන්ගේ රූප වලට (මැවිල්ලට) නමස්කාර කළෝය. එමනිසා අවධානයට ලක් වූ ක්‍රියාවන් මනසින් හටගත්තේය. රූප නමස්කාරය නැමැති උල්පතතේ දෙවියන් වහන්සේ පිළිබඳව වැරදි අදහස් හටගන්නවා පමණක් නොව එයින් ගලායන රූප නමස්කාරය නැමති ජලය පොළොව අපවිත්‍ර කරන්නේය. ඔවුන් තමන්ගේම රූප නමස්කාරය කරන්නන් බවට පත් වී ඇත. රූප නමස්කාර කරන්නන් දෙවියන් වහන්සේ පිළිබඳව සිතන්නා වූ කාරණා සහ ක්‍රියාවන් ලෙස ඒවා සැබෑයැයි සිතති.

ජාතීන් දෙවියන් වහන්සේ පිළිබඳ කාරණා අනිසි ලෙස භාවිතා කිරීම නිසා ඉතා ඉක්මනින් ආගමික වශයෙන් ඔවුන් පහතට වැටෙනවා පෙනෙන්නේය. ඊශ්‍රායෙල් ජනතාව තුල මෙම තත්වය පැහැදිලි ලෙසම තහවුරු වී ඇත. එමෙන්ම ඉතිහාසයේ දි සභාව තුලත් ඒ තහවුරු වී තිබේ එම නිසා දෙවියන් වහන්සේගේ උසස් වූ අදහස සභාවට වැළැක්විය නොහැකිය ඕනෑම අදහසක් තුළ සභාව සතු ශක්ති ප්‍රමාණය හීන වී ඇත සභාවේ නමස්කාරය ඇගේ සදාචාර සම්පන්න බව මුල සිට අගට පිරිහීමට ලක්වී තිබේ දෙවියන් වහන්සේගේ උසස් වූ අදහසට යටත් වන විට ඕනෑම සභාවකට පළමුවෙන් තිබූ ස්වාභාවය ඉවත් කර ගැනීමට සිදුවේ

කිතුණු සභාවේ ආලෝකය නැතිවීමට පෙර ඇගේ නපුරු මාර්ගවලින් හැරී සෘජු දේව ධර්මයේ පදනම වෙතට පැමිණිය යුතුය. දෙවියන් වහන්සේ කැමැති කුමකට ද යන ප්‍රශ්නයට සභාව නිරායාසයෙන්ම වැරදි පිළිතුරු ලබාදීම තුළ දෙවියන් වහන්සේගෙන් වෙන්ව සිටිති. එසේ වුවත් ඇදැහිල්ල නාම මාත්‍රිකාව නොකඩවා අල්ලාගෙන සිටිති. ඇගේ ප්‍රායෝගික ක්‍රියාවල ඇදහිල්ල ව්‍යාජව පවතියි. සභාවේ බහුතරයක් දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන්නාවූ ඇදහිල්ලට වෙනස්ව ජීවත්වෙති. ඔවුන්ගේ මිත්‍යා විශ්වාසයන් ඉතා අන්තරායකාරී සහ මරණීයව තිබේ.

වර්තමාන කිතුනු සභාව බරපතල ලෙස වංකකමට බැඳී සිටීමෙන් පවිත්‍ර වී දෙවියන් වහන්සේගේ අදහස උසස් කිරීමට සුදුසු වීම පිණිස නැවත හැරී ආ යුතුය. සභාවේ සියළුම යාච්ඤා කිරීම් සහ සේවාවන් මෙම කාරණයට මූල් ස්ථානය දෙමින් ක්‍රියා කල යුතුය.

**"අපට ඇත්තේ එක දෙවිකෙනෙක් වන පියාණන් වහන්සේය, සියල්ල පැමිණ තිබෙන්නේ උන්වහන්සේගෙන්ය." (1 කොරින්ති 8 : 6)**

# ස්වාමීන් වහන්සේ අපගේ බලාපොරොත්තුවයි

(රිච් කාම්වෙල් විසිනි)

පෙරමග දූතයා මෙම කලාපය සැබෑ ලෙස දෙවියන් වහන්සේව දැනගැනීමේ වැදගත්කම ඉලක්ක කරගෙන සකස් කර ඇත. මම මෙම පණිවිඩයෙන් බලාපොරොත්තු වන්නේ දෙවියන් වහන්සේගේ ගුණාංග (ස්වාභාවය) පිළිබඳව ඔබගේ අවබෝධය වර්ධනයවීම පමණක් නොව නමුත් ගැඹුරින් උන්වහන්සේට ගෞරව ආදරය දැක්වීමට ඔබව යොමු කිරීමට සහ උන්වහන්සේ සමග සමීප සම්බන්ධතාවයට ඔබව යොමු කිරීමටයි. මෙම කලාපයේ සමහර ලිපි ඉතා ගැඹුරු සහ කියවා තේරුම් ගැනීමට අමතර වෑයමක් දැරිය යුතුය. නමුත් එහි ප්‍රතිඵලය ඔබගේ හදවත්වලට අනර්ඝ වස්තුවක්ව තිබෙන බවට මම පොරොන්දු වෙමි.

ගීතාවලිය 71 ඃ වන ගීතිකාව උපයෝගී කරගෙන දෙවියන් වහන්සේ පිළිබඳ සමහර සත්‍යතාවයන් ඔබ සමඟ බෙදා ගැනීමට දෙවියන් වහන්සේ මාගේ හදවත පෙළඹ වූ සේක. ප්‍රශ්ණ බාදා සහ සෝදිසි කිරීම් මධ්‍යයේ සිටින විට ගීතාවලිය 71 ඃ වන ගීතිකාව කියවද්දී මහත් ධෛර්‍ය්‍යයක් ලබාදෙනු ඇත. මෙම ගීතිකාව ලියන කතෘවරයාගේ ජීවිතය ඒ මොහොතේ ඉතා කටුක වාතාවරණයක් මැද තිබුණි.

ඔහු තමාගේ පරාජයට හේතුවූ සැබෑ සතුරා හඳුනාගත්තේය.(ගීතාවලිය 71 ඃ 4, 10 -11, 13) ඔහු මහළු වයසට බොහෝ සෙයින් පැමිණ තිබෙන නිසා ඔහුගේම ශක්තිය හීන වී තිබේ. (ගීතාවලිය 71 ඃ 9) බොහෝ ප්‍රශ්න ගැටළු වලට, විපත්ති වලට මුහුණ දී ඒවායේ අත්දැකීම ඔහුට තිබේ. එමෙන්ම පොළොවේ ගැඹුරේ සිටියාක් මෙන් හැඟීම් ඔහු සතුය. (ගීතාවලිය 71 ඃ 2-4,12) ස්වාමීන් වහන්සේගේ සැනසිල්ල ඔහුට අවශ්‍යව තිබේ. (ගීතාවලිය 71 ඃ 21)

ඒ අතරම මේ සියළු කරදර යටතේ පවතින්නාවූ බලාපොරොත්තු රහිත බව වෙනුවට ඔහු බලාපොරොත්තුවෙන් පූර්ණ වූයේය.

**"එහෙත් මම නිතරම බලාපොරොත්තු වෙමින් වඩා වඩා ඔබට ප්‍රශංසා කරන්නෙමි"** (ගීතාවලිය 71 ඃ 14) මක්නිසාද ඔහු තාමාගේ දෑස් ස්වාමීන් වහන්සේ මත රැඳවා ගෙන උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තුව ඇතිව සිටියේය.

**"මක්නිසාද ස්වාමිවූ දෙවියන් වහන්ස, මාගේ බලාපොරොත්තුව ඔබය. තරුණ වයස පටන් මාගේ විශ්වාසය ඔබය ."**
(ගීතාවලිය 71 ඃ 5)

අපට බලපා තිබෙන්නාවූ දුෂ්කරතාවයන් කොහොම වුවත් ගීතිකාකරුවා මෙන් අපි ස්වාමීන් වහන්සේ වෙතට හැරෙන සෑමවිටම අපට බලාපොරොත්තුව ඇත්තේය. මේ මොහොතේදීත් ඔබ සෝදිසි කිරීම් වලින් පීඩනයට ලක්වී සිටිනවා වුවත්, සමහර විට අනතුරු සහිත ස්වභාවය ඔබව යටකරගෙන තිබෙනවා වූවත් ස්වාමීන් වහන්සේ පිළිබඳ මෙම සත්‍යතාවය අනුගමනය කර ඔබේ බලාපොරොත්තුව ගැඹුරින් උන්වහන්සේ මත තබන්න.

## ස්වාමීන් වහන්සේ ශක්තිමත් වූ රැකවරණයයි.

**"ස්වාමීනි...., ඔබ විශ්වාස කරමි. කිසි කලෙකත් ලැජ්ජා නොවෙම්වා...." (ගීතාවලිය 71 ඃ 1) "මා නිතරම යන පිණිස මට පර්වත නිවාසයක් වුව මැනව. මා ගළවන්නට ඔබ අණ දී තිබේ. මක්නිසාද මාගේ පර්වතය හා බල කොටුවත් ඔබය." (ගීතාවලිය 71 ඃ 3) "මම බොහෝ දෙනෙකුට විස්මයක් මෙන් වෙමි. නමුත් ඔබ මාගේ බලවත් රක්ෂාස්ථානයයි."** (ගීතාවලිය 71 ඃ 7)

ජීවිතයේ කුණාටුව මධ්‍යයේ එය වඩා හොඳින් දැන ගන්නේ කෙසේද...?. රැකවරණය ලබා ගැනීමට අපි යා යුත්තේ කවුරුන් වෙතටද...?. අර්බුධකාරී අවස්ථාවේදී අපට යහපත් ව සිටින්නේ සහ ශක්තිය ලබාදීමට හැකි කාටදැයි කියා අවබෝධ කරගනිමු. (නාහුම් 1 ඃ 7) ස්වාමීන් වහන්සේගේ නාමය ධර්මිෂ්ඨයාව ආරක්ෂා කරන බලකොටුවකි. (හිතෝපදේශ 18 ඃ 10)

**"දෙවියන් වහන්සේගේ මාර්ගය සම්පූර්ණය. ස්වාමීන්ගේ වචනය නිර්මල ය. උන් වහන්සේ තමන් සරණ කොට ගන්න සියල්ලන්ට පලිහක් වන සේක."**
(ගීතාවලිය 16 ඃ 30) අපව ආවරණය කරමින් ආරක්ෂාව ලබා දෙන සේක. (ගීතාවලිය 91 ඃ 4)

**"දෙවියන් වහන්සේ අපේ සරණ හා ශක්තියය. දුකේදී ඉතා ළංවු පිහිටක්ය. එබැවින් පොළොව වෙනස් වෙතත්, මුහුද මැද පර්වත සැලෙසත්, එහි ජල ගුගුරා කැළඹෙමින් එහි නගින රළ වේගයෙන් පර්වත කම්පාවෙතත් භය නොවන්නෙමුව."** (ගීතාවලිය 46ඃ-3)

## සෑමවිටම ස්වාමීන් වහන්සේ වෙතට ළඟාවිය හැකිය.

**"මා නිතරම යන පිණිස මට පර්වත නිවාසයක් වුව මැනව. මා ගළවන්ට ඔබ අණදී තිබේ. මක්නිසාද මාගේ පර්වතය හා බලකොටුවත් ඔබය"**
(ගීතාවලිය 71 ඃ 3)

ස්වාමීන් වහන්සේ නැමැති පර්වතය වෙතට ඉතා අනර්ඝ ලෙස ගීතිකාකරුවාට සමීපවිය හැකි වූයේය. අපට ඊට වඩා කොපමණ වැඩියෙන් ක්‍රිස්තුස් වහන්සේ වෙතට ළඟාවීමට හැකි ද...? උන්වහන්සේ නිසා අපට කරුණාවේ සිංහාසනය වෙතට ළඟා විය හැකිය.
**"එබැවින් අපට දයාව ලැබෙන පිණිස ද අපේ ඕනෑකම්වලදී අපට උපකාරයට අනුග්‍රහය සම්බවන පිණිසද නිසැකකමින් කරුණාවේ සිංහාසනයට ළඟාවෙමු."** (හෙබ්‍රෙව් 4 ඃ 16) ස්වාමීන් වහන්සේ අපව අතහැර නොයන බව අපගේ ජීවිත වලින් ම අවබෝධ කරගත හැකිය. එමනිසා උන්වහන්සේගේ අභිමුඛයේ ප්‍රීතිය අත්දකින පිණිස උන්වහන්සේ සමග සහභාගිකම් පැවැත්වීමටත්, අපගේ ජීවිතවලට අවශ්‍ය සියළුම දිව්‍යමය සැපයීම ලබා ගැනීමටත්, අපට ආරාධනා කර තිබෙන සේක. අපි උන්වහන්සේ වෙතට ළඟා වනවිට උන්වහන්සේ අපට ළංවන සේක.(යාකොබ් 4 ඃ 8) එමෙන්ම උන්වහන්සේගේ අභිමුඛත්වය, උන්වහන්සේගේ සමාදානය, උන්වහන්සේගේ සැපයීම, සියළුම දේම වෙනස්කරනු ලබන සේක.

**"නුඹලාගේ ඉවසිලිවන්තකම සියළු මනුෂ්‍යයන්ට දැනගන්ට ලැබේවා. ස්වාමීන් වහන්සේ ළංව සිටින සේක. නුඹලා කිසිවක් ගැන කනගාටු නොසිතා, සියල්ලේදී ස්තූතිදීම සමග යාච්ඤාවෙන් ද, කන්නලව්වෙන් ද, නුඹලාගේ ඉල්ලීම් දෙවියන් වහන්සේට දන්වාපල්ලා. එවිට කිසිනුවණකින් දැනගත නොහැකිවූ දෙවියන් වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් වහන්සේ තුල නුඹලාගේ සිත්ද, සිතුවිලිද ආරක්ෂා කරනවා ඇත."**
(පිලිප්පි 4 ඃ 5-7)

## ස්වාමීන් වහන්සේගේ විශ්වාසවන්තකම ඔබට තහවුරුකර සිටිනසේක.

**"මව් ගැබෙහි පටන් ඔබ මා ඉසුළු සේක. මවු කුසින් මා පිටතට ගතිතේ ඔබය. මාගේ ප්‍රශංසාව නිතරම ඔබ ගැන වන්නේය."**
(ගීතාවලිය 71 ඃ 6)

**"මහළු වයසේදී මා ඉවත නොහළ මැනව. මාගේ ශක්තිය පිරිහෙන කල මා අත්නෑරිය මැනව".**
(ගීතාවලිය 71 ඃ 9)

ඔබ ස්වාමීන් වහන්සේගේ හස්තයේ කර්මාන්තය වනසේක. (ස්වාමීන් වහන්සේගේ දෑත්වලින් ඔබව නිර්මාණය කළසේක.) එබැවින් උන්වහන්සේ ඔබගේ ඇතුලාන්තය දන්නා සේක. උන්වහන්සේ වඩා හොඳින් ඔබ ගැන සලකන සේක. (ගීතාවලිය 139 ඃ 1-16) එසේ වුවත් අපි පව්කාර අපගේ ජීවිතවලින් උන්වහන්සේට අවිශ්වාසවන්තව වූයෙමි. උන්වහන්සේ සෑම විටම අපගේ විශ්වාසවන්තව සිටින්නා වූ දෙවියන් වහන්සේ වන සේක.

**"අප විනාශනුණේ ස්වාමින්වහන්සේගේ කරුණා වල් නිසාත් උන්වහන්සේගේ අනුකම්පාවක් නොනවතින නිසාත්ය. ඒවා උදයෙන් උදය අලුත්ව තිබේ. ඔබගේ විශ්වාසවන්තකම මහත්ය. මගේ කොටස නම් ස්වාමීන් වහන්සේයයි. මගේ ආත්මය කියයි. එබැවින් උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්නෙමි."**

(විලාපගී 3 ඃ 22 - 24) උන්වහන්සේ අපට මෙලෙස පොරොන්දු වී තිබෙන සේක.

**"නුඹලාට ඇති දෙයින් සතුටු වී වස්තු තෘෂ්ණාවෙන් තොරව**

4 පිටුවට

3 පිටුවෙන්

# ස්වාමීන් වහන්සේ අපගේ....

සිටපල්ලා. කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි. කිසි අන්දමකින්වත් නුඹ අත් නොහරිමියි. උන්වහන්සේම කියා තිබේ. මෙසේ ස්වාමීන් වහන්සේ මාගේ උපකාරයාණෝය. මම බය නොවන්නෙමි. මනුෂ්‍යයා මට කරන්නේ කුමක්ද......? කියා මහත් ධෛර්යයෙන් යුක්තව කියමුව."

(හෙබ්‍රෙව් 13 ඃ 5 - 6) අපගේ ජීවිත වල උසස් සහ බෙලහීන (පහත්) දේවල් උන්වහන්සේට භාරදෙමින් අපගේ වාතාවරණයන් උන්වහන්සේට පවරා දෙන තෙක් බලාසිටින සේක. "අපව අත්හැර දැමීමට අපව ගෙන නොයන සේකැයි." පැරණි සුභාරංචි ගීතිකාවක සඳහන්ව තිබේ.

## ඔබට ශක්තිය ලබාදීමට ස්වාමීන් වහන්සේට හැකිව සිටිනසේක.

**"දෙවියන් වහන්ස, ඔබගේ ශක්තිය එන පරම්පරාවටත් ඔබගේ බලය මතු පැමිණෙන සියල්ලන්ටත් මා විසින් ප්‍රකාශ කරන තෙක් මහළුව හිස පැසුණු කල්හී පවා මා අත්නොහරිය මැනව."** (ගීතාවලිය 71 ඃ 18) වැළැක්විය නොහැකි ලෙස අපගේ ශක්තිය බිඳවැටී තිබෙන විට (ගීතාවලිය 71 ඃ 9) ස්වාමීන් වහන්සේගේ සීමාරහිත සහ අවසන් නොවන ශක්තිය අපට ලබා දෙන සේක.

**"ගෞරවයත්, මහිමතාවත්, උන් වහන්සේ ඉදිරියෙහිය. ශක්තියත් අලංකාරයත් උන්වහන්සේ ශුද්ධස්ථානයෙහිය."**

(ගීතාවලිය 96 ඃ 6) උන්වහන්සේ මහා බලයෙන් යුක්ත වන සේක.

**"අපේ ස්වාමීන් වහන්සේ උතුම්ය. මහා බලයෙන් යුක්තය. උන්වහන්සේගේ ඥානය අනන්තය."** (ගීතාවලිය 147 ඃ 3) උන්වහන්සේගේ බලය කරුණුකොටගෙන තරකා පිහිටුවා තිබෙන සේක. විඩාවූ අයට උන්වහන්සේ ශක්තිය ලබා දෙන සේක.

**"නුඹලාගේ ඇස් ඔසවා බලා පල්ලා මේවා මැවුවේත්, මේවායේ සේනාව ගණන් වශයෙන් පිටතට පමුණුවන්නේත් කවුද?. උන්වහන්සේ මේ සියල්ලට නම් කියා හඬගසන සේක. උන්වහන්සේගේ බලයේ මහත්කම නිසාද, උන්වහන්සේ ශක්තියෙන් බලවත් බැවින් ද එකක්වත් නැතිව නොතිබේ."** (යෙසායා 40 ඃ 26)

**"උන්වහන්සේ ක්ලාන්තවූ අයට ශක්තිය දෙන සේක. බලය නැත්තාට සවිය වැඩි කරන සේක."** (යෙසායා 40 ඃ 29) අපි උන්වහන්සේ දෙස බලා සිටිනවිට උන්වහන්සේ අපේ ශක්තිය අළුත් කරන සේක. (යෙසායා 40 ඃ 31) දෙවියන් වහන්සේම අපේ ශක්තියයි.

**"ස්වාමීන් වහන්සේ මාගේ ශක්තියය. මාගේ පලිහය. මාගේ සිත උන්වහන්සේ කෙරෙහි විශ්වාස කළේය. මම උපකාර ලැබුයෙමි. එබැවින් මාගේ සිත අතිශයින් ප්‍රීතිවන්නේය. මාගේ ගීයෙන් උන්වහන්සේට ප්‍රශංසා කරන්නෙමි."**

**උන්වහන්සේට ප්‍රශංසා කරන්නෙමි"** (ගීතාවලිය 28 ඃ 7)

**"මාගේ මාංශයත් සිතත් ක්ෂයවේ. දෙවියන් වහන්සේ මාගේ සිතේ ශක්තියද සදාකාලයට මාගේ කොටසද වන සේක."** (ගීතාවලිය 73 ඃ 26) ස්වාමීන් වහන්සේගේ ශක්තිය කරුණුකොටගෙන අපට සියල්ල කළ හැකිය. (පිලිප්පි 4 ඃ13) දෙවියන් වහන්සේගේ ශක්තිය අප තුළ සහ අප තුලින් ක්‍රියාත්මක වන විට අපගේ ජීවිත උන්වහන්සේගේ කරුණාව සහ මහිමය උදෙසා සාක්ෂියක් වන්නේය. (පේත්‍රුස් 4 ඃ11)

## ඔබගේ ප්‍රශ්ණ සහ ගැටළු වලින් ඔබව පිටතට ගෙන යහපත් දේ කිරීමට ස්වාමීන් වහන්සේට හැකි ව සිටිනසේක.

**"දෙවියන් වහන්ස....., ඔබගේ ධර්මිෂ්ඨකම ඉතා උසස්ය. මහත් දේවල් කළාවූ දෙවියන් වහන්ස, ඔබට සමාන කවුද?. බොහෝ තද දුක් අපට පැමිණෙ වූ ඔබ නැවත අපි ජීවත් කොට පොළොවේ ගැඹුරු තැන්වලින් අප නැවත ගොඩ ගන්නා සේක."** (ගීතාවලිය 71 ඃ 19 - 20)

අපගේ දෙවියන් වහන්සේ අපූර්වවූ දෙවියන් වහන්සේය. අපගේ වාතාවරණයන් වෙනස් කිරීමට උන්වහන්සේට බලය තිබෙන සේක.

**"වැලපෙන සියල්ලන් සනසන්නට ද, සියොන්හි වැලපෙන්නන් පළඳවමින්, අළු වෙනුවට මාලාවකුත්, වැලපීම වෙනුවට ප්‍රීතිය නමැති තෛලයත්, ක්ලාන්ත සිතක් වෙනුවට ප්‍රශංසාව නැමැති වස්ත්‍රයක් ඔවුන්ට දෙන්ටද උන්වහන්සේ මා එවූ සේක."**

(යෙසායා 61 ඃ 3)

සතුරා අයහපත උදෙසා මොන දේ සැලසුම්කලත් දෙවියන් වහන්සේට උන්වහන්සේගේ අභිප්‍රාය සම්පූර්ණ කිරීමට හැකිව සිටින සේක. (උත්පත්ති 50 ඃ 20) අපි අපගේ ප්‍රශ්ණ ගැටළු වලින් සහ සෝදිසි කිරීම් වලින් දෙවියන් වහන්සේ වෙතට හැරෙන විට දෙවියන් වහන්සේ උන්වහන්සේගේ මහිමය සහ ගෞරවය උදෙසා අප තුළ ක්‍රියා කිරීමට හැකි ව සිටිනසේක. දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන්ට, උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබුවන්ට සියළුමදේම යහපත පිණිස එකට ක්‍රියාකිරීමට සලස්වන සේක. (රෝම 8 ඃ 28)

අපගේ මුළු හදවතින් දෙවියන් වහන්සේව විශ්වාස කරන විට උන්වහන්සේ අපගේ මාර්ගයේ සමතලා කරන සේක. (හිතෝපදේශ 3 ඃ 5 - 6) දුක් පීඩා වලදී අපි අධෛර්යය නොවී අවසානය දක්වා ස්ථිරව සිටින විට අපි මෙලෙස දකින්නෙමු.

**"ඉවසූ අය ආශිර්වාද ලද්දෝයයි අපි කියමුව. යෝබ්ගේ ඉවසීම ගැන නුඹලා අසා තිබේ. ස්වාමීන් වහන්සේගේ තීරණය ද නුඹලා දුටුවහුය. ස්වාමීන් වහන්සේ බොහෝ අනුකම්පා ඇත්තා වූ දයාවන්ත වූ කෙනෙක්ය."** (යාකොබ් 5 ඃ 11)

## ස්වාමීන් වහන්සේට, මුදාගැනීමට, ගළවා ගැනීමට, උපකාර කිරීමට හැකි ව සිටින සේක.

**"ඔබගේ ධර්මිෂ්ඨකමින් මා මුදා නිදහස් කළ මැනව. ඔබගේ කන මා දෙසට නමා මා ගැළෙව්ව මැනව."** (ගීතාවලිය 71 ඃ 2) **"දෙවියන් වහන්ස, මා කෙරෙන් දුරුනුව මැනව, මාගේ දෙවියන් වහන්ස, මට උපකාර කරන්ට ඉක්මන්වුව මැනව."** (ගීතාවලිය 71 ඃ 12)

අපගේ සතුරන්ගෙන් අපව මුදා ගැනීමට අපේ දෙවියන් වහන්සේට හැකි ව සිටින සේක. (ගීතාවලිය 18 ඃ 17) අපේ භයෙන් අපව මුදා ගන්නා සේක. (ගීතාවලිය 34 ඃ 4) සියළු ප්‍රශ්න සහ පීඩාවලින් අපව මුදාගන්නා සේක. (ගීතාවලිය 34 ඃ 17 - 19) අප මුහුණ දෙන්නා වූ පීඩාවන්, බලාපොරොත්තු රහිත තත්වයන් මොනවා වුවත් අපි උන්වහන්සේට මොරගසනවිට උන්වහන්සේ අපගේ විපත්තිවලින් අපව මුදා ගන්නා සේක. (ගීතාවලිය 107 වන ගීතිකාව බලන්න.) ස්වර්ගයත්, පොළොවත්, මැවුවාවූ තැනැන් වහන්සේගෙන් අපට උපකාරය පැමිණේ. උන්වහන්සේට අපහසු කිසිවක් නැත්තේය. (ගීතාවලිය 121 ඃ 2, යෙරමියා 32 ඃ 17)

## ස්වාමින් වහන්සේට ඔබට අවශ්‍යය සැනසිල්ල ලබා දීමට හැකි ව සිටින සේක.

**"මගේ උතුම්කම වැඩිකොට නැවත හැරී මා සැනසුව මැනව"** (ගීතාවලිය 71 ඃ 21)

අපි දුකින් සිටින විට අපව සම්පූර්ණ ලෙස අවදි කිරීමට සහ ගැඹුරුවූ සැනසිල්ල අපට ලබාදීමට උන්වහන්සේට හැකිව සිටින සේක.

**"දයාබර කරුණාවල පියවූද, සෑම සැනසිල්ලේ දෙවිවූ ද අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පියවූ දෙවියන් වහන්සේට ප්‍රශංසාවේවා. අපි දෙවියන් වහන්සේගෙන් යම් සැනසිල්ලක් ලැබුවෙමුද ඒ සැනසිල්ල කරුණුකොට ගෙන කොයි පීඩාවක් නුමුත් විඳින්නන් සනසන්ට අපට පුළුවන් වන පිණිස උන්වහන්සේ අපේ සියළු පීඩා වලදී අප සනසනසේක."**

(2 කොරින්ති 1 ඃ 3 - 4) අපගේ වේදනාත්මක වාතාවරණය වර්ධනය වනවිට හෝ අප මුහුණ දෙන්නා වූ කරදරකාරි ස්වාභාවයෙන් හැම පැත්තෙන්ම පවතින විටදී වුවත් සටන් වැදීමට (බොරබැදීමට) නොහැකිවිටදී වුවත්, භය ඇති වී තිබෙන විටදී වුවත්, දෙවියන් වහන්සේට අපව සැනසීමට පුළුවන්ව සිටිනසේක. (2 කොරින්ති 7 ඃ 5 - 6)

ප්‍රිය මිත්‍රවරුණි ඔබගේ සියළුම පීඩාකාරි තත්වයන් වලදී ස්වාමීන් වහන්සේට සියල්ලෙන් සම්පවෙන්න. ඔබ ගැන සැලකීමට උන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක. උන්වහන්සේ ඔබගේ ජිවිතය අපූර්ව වූ දෙවියන් වහන්සේගේ සාක්ෂිකාරයෙක් කරන සේක.

**"එහෙත් මම නිතරම බලාපොරොත්තු වෙමින් වඩ වඩා ඔබට ප්‍රශංසා කරන්නෙමි."** (ගීතාවලිය 71 ඃ 14)

# දෙවියන් වහන්සේගේ ගුණාංගවලට බොහෝ සෙයින් ළඟාවීම

**(පොල් වේසර් විසිනි)**

**"මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන් වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම 3 ඃ 23) ඔබට විරුද්ධව පව් කළෙමි. ඔබගේ ඇස් හමුයෙහි නපුරු ව තිබෙන දේ කෙළෙමි. එබැවින් ඔබ කථා කරන කල සාධාරණ සේක. විනිශ්චය කරන කල ඔබ ශුද්ධ සේක."** (ගීතාවලිය 51 ඃ 4)

ඉහතින් සඳහන්වන්නා වූ බයිබල් පද වල මනුෂ්‍යය දෙවියන් වහන්සේ පනවා තිබෙන්නා වූ දිව්‍යමය නියෝගයට විරුද්ධව ක්‍රියාකිරීමේ අදහස පිළිබඳව අපගේ සමාජ සංස්කෘතියේ මනුෂ්‍යයන් සිනහ වන්නෝය. ඒ අතරම පාපය සහ එහි ගුණාංග වැළඳගනු ලබන්නෝ ය. අපගේ සංස්කෘතිය යහපත නපුරු ලෙසත්, නපුර යහපත ලෙසත් ප්‍රකාශ කරති. එළිය වෙනුවට අඳුරත්, අඳුර වෙනුවට එළියත් ආදේශ කරනු ලබති. (යෙසායා 50 ඃ 20) පැහැදිලි ප්‍රවණතාවයක් රඳවාගෙන මනුෂ්‍යයාගේ පාපයේ බරපතලකම සාක්ෂි සහිතව තහවුරු කරමින් දේශනා කරන්න. මෙය සම්පූර්ණ කිරීමට හොඳම උපක්‍රමය බයිබලයේ මනුෂ්‍යයාව පෙන්වන්නා වූ ආකාරය පමණක් නොව, බයිබලයේ දෙවියන් වහන්සේවත් පෙන්වා දෙන්න වූ ආකාරය ඉගැන්වීමයි. ඔවුන් ගොදුරු වී සිටින්නා වු  පාපයේ දරුණු කම තේරුම් ගැනීමට නම්, පව්කළ විට ඔවුන් විරුද්ධ වන්නේ කාටද කියා ශුද්ධ ලියවිල්ලේ පෙන්වාදෙන තැනැන් වහන්සේව අවබෝධ කරගැනීමට ඔවුන් පැමිණිය යුතුය. නොපැකිලිව සහ ඉතා මුරණ්ඩු ලෙස ක්‍රියා කරන මිත්‍යාදෘෂ්ඨිකයන්ට කුඩා ප්‍රමාණයෙන් හෝ දෙවියන් වහන්සේ කවුද කියා අවබෝධ කර දියයුතුය. ඔහු තමාගේ පාපය ගැන සිතේ ඇති බර නිසා ක්ෂණිකවම කඩා වැටීමට පුළුවන.

වර්තමානයේ අපගේ සමාජය සියලු දේවල දී පාපය දරා සිටින බව අනාවරණය කර ගනිමු. මනුෂ්‍යයාට විරුද්ධව, සමාජයට විරුද්ධව, සොබාදමට විරුද්ධව පව් කරන අතර ඉතා හොඳින් ම අපගේ සමාජ සංස්කෘතියේ පුද්ගලයන් දෙවියන් වහන්සේට විරුද්ධ පව් කරනු ලබන්නෝය. සියළුම පව් අවසානයේ දී සහ ඉතාම බරපතල ලෙස දෙවියන් වහන්සේට විරුද්ධව කරන්නාවු පාප ලෙස ශුද්ධ ලියවිල්ලේ පෙන්වා දෙන සේක. දාවිත් රජතුමා ඔහුගේ සෙනගගේ විශ්වාසය කඩකර, වෛශ්‍යයාකමට හසුවී අහිංසක (නිදොස්) මනුෂ්‍යකේව මරා දැමුවේය. ඒ අතරම නානාන් අනාගතවක්තෘ පැමිණ තදින් දෝෂාරෝපණය කල විට දාවිත් මුළු හදවතින්ම පසුතැවිලි වූයේය. ඔහු පසුතැවිලි වෙද්දී තමාගේ වරද කියාදෙමින් මෙලෙස මොරගැසුවේය. **"ඔබට විරුද්ධ ව ඔබට පමණක්ම විරුද්ධව  පව්කළෙමි...."**
(ගීතාවලිය 51 ඃ 4)

මෙම බයිබල් පදයෙන් අපි ඉතා වැදගත් කාරණා දෙකක් ඉගෙන ගන්නෙමු. පළමු වෙනුව, අපි අපගේ යටතේ සිටින ඕනෑම කෙනෙකුට විරුද්ධව පව්කලා වුවත්, සියළුම පාපයන් ප්‍රථමයෙන් සහ අන් සියල්ලන්ට පෙර දෙවියන් වහන්සේට විරුද්ධව කරනු ලබන්නෝය. දෙවනුව පාපය ඉතා දරුණු ව තිබෙනවා පමණක් නොව, අනිත් මනුෂ්‍යයන්ට හෝ මැවිල්ලේ සියළු දේවලට විශාල විනාශයක් ගෙන දෙන්නේය. එම නිසා ප්‍රධාන වශයෙන් සහ විශේෂයෙන් මහිමාන්විත දෙවියන් වහන්සේට විරුද්ධ ව, බෙහෙවින්ම උන්වහන්සේගේ සිත රිදවීමට යොමු වී තිබෙන නිසා දෙවියන් වහන්සේගේ මැවිල්ලේ නීතිය (නියමයන්) පිළිපදිමින්, උන් වහන්සේගේ ඉතා සම්පූර්ණ වූ ප්‍රේමය , ආදරය භුක්ති විඳීමට සුදුසු වන්නේ කවුද....? එබැවින් මනුෂ්‍යන් මැවිල්ලට විරුද්ධව කරන්නාවූ ඔවුන්ගේ  ඉතා දුෂ්ඨ වූ පාපයෙන් දෙවියන් වහන්සේගේ ආධිපත්‍යයට සහ මහිමයට විරුද්ධව කරන බව අවබෝධ කරගත යුතුය. දෙවියන් වහන්සේ ගැන සැබෑ ලෙස හඳුනා ගෙන සිටින මානුෂ්‍යයන් දෙවියන් වහන්සේ නියෝග කර තිබෙන කුඩා හෝ නීතියක් කඩකිරීමෙන් වචනයෙන් කිව නොහැකි දරුණු වරදක් කරන බව අවබෝධ කර ගනිති. එසේ වුවත් දෙවියන් වහන්සේගේ කැමැත්ත නොදන්නාවූ මනුෂ්‍යයන් පාපය කුඩා කාරණයක් ලෙස සැලකීමට යොමුව සිටින බැවින් එහි ප්‍රතිවිපාකය අත්විඳින්නෝ ය.

කිතුණු ඇදහිල්ලේ පදනම නිවැරදි ලෙස දැකීමට නම් දෙවියන් වහන්සේ පිළිබඳව සැබෑ ලෙස තේරුම් ගැනිමට අත්‍යවශව තිබේ. දෙවියන් වහන්සේගේ කැමැත්ත පිළිබඳව වැරදියට දැකීමට යොමු වීමෙන් අනිත් සියළුම කාරණා වැරදියට දැකීමට උපරිම ලෙස යොමුවේ. මෙම සත්‍යතාවයට විශේෂයෙන් සැලකිල්ල යොමු කිරීමත් සමග පාපය පිළිබඳව අවධානය යොමු කිරීමට හැකිවේ. ගීතාවලිය  50 ඃ වන ගීතිකව තුල ඊශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේව අමතක කර දමා හෝ උන්වහන්සේගේ චරිත ගුණාංග වල ඉතා අවශ්‍යතාව්‍යය සත්‍යතාවයන් ඉවත දමා (උන්වහන්සේට නිග්‍රහ කර ඇත. උන්වහන්සේ අවමානයට ලක්කර ඇත.) දෙවියන් වහන්සේත් අධර්මිශ්ඨකම කරණු කොටගෙන බලපෑමක් ඇති කිරීමට නොහැකි තත්වයට පත් වී සිටින නිසා උදාසීනව සිටින තමන් වගේ යැයි සිතීමට ඔවුව් යොමුව් සිටින්නෝය. (ගීතාවලිය 50 ඃ 21) පාපය වැරදියට සැලකිල්ලට ගෙන ඇති නිසා දෙවියන් වහන්සේ පිළිබඳව වැරදි මතයකට පැමිණ සිටිති. ඔවුන් සියලුම සදාචාර සම්පන්න ක්‍රියාවන් ඉවත් කර දමා අත්හැර දමා සහ ලැජ්ජාව හෝ භයක් නැතිව අසම්මත හැසිරීම් වල යෙදී සිටිති. ඔවුන්ගේ කැරළිකාරකම නිසා විනාශයට යොමු වී ඇත. ඔවුන් දැනගැන්ම නැති නිසා නාස්ති වී සිටිති. (හොෂෙයා 4 ඃ 6)  මේ හේතුව නිසා යෙරමියා අනාගතවක්තෘ දෙවියන් වහන්සේ පිළිබඳව දැන ගැනීමේ වටිනාකම සියළු විශිෂ්ඨ දේවල  වටිනාකමට වඩා , මහත් වු අනර්ඝත්වයෙන් යුතුව තිබෙන බව ප්‍රකාශකර ඇත.

**"ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක. ප්‍රඥාවන්තයා තමාගේ ප්‍රඥාව ගැන පාර්ට්ටුකර නොගටීවා. බලවන්තයාද තමාගේ බලය ගැන පාර්ට්ටුකර නොගනීවා. වස්තුකාර්යා තමාගේ වස්තුව ගැන පාර්ට්ටුකර නොගනීවා. නමුත් පාර්ට්ටුකර කරගන්නා පොළවෙහි කරුණාවත්, විනිශ්වයත්, ධර්මිෂ්ඨකමත් පවත්වන ස්වාමීන් වහන්සේ මමයැයි තේරුම් ගෙන මා දැනගැනීම නම්වු කාර්ණය ගැනම පාර්ට්ටු ගනීවා. මක්නිසාද මා ප්‍රීය වන්නේ මේ දේවලට යයි ස්වාමීන් වහන්සේ කියන සේක."**

(යෙරමියා 9 ඃ 23 - 24 )

එහිදී දේව මාලිගාව තුල සහ පොදු මාර්ග තුල දෙවියන් වහන්සේව නොදැන බහුල ලෙස ක්‍රියා කරනවා යැයි පැවසීම අතිශෝක්තියක් නොවේ. දෙවියන් වහන්සේ පිළිබඳව බයිබලයේ සඳහන් කර තිබෙන නිශ්චිත කාරණාවලට මානුෂ්‍යයන් විශ්වාසයෙන් යුතුව සමීප වන්නෝය. නමුත් මහත් බහුතරයක් දෙන පුද්ගලිකව දෙවියන් වහන්සේ වෙතට නැඹුරු වෙනවට වඩා හිතමතාම පාපයට රැවටෙන්නෝය, දෙවියන් වහන්සේගේ ප්‍රේමය, අනුකම්පාව, දයාව පිළිබඳව මහත් වූ කාරණාවන් මනුෂ්‍යයන් බොහෝ සේ කථා කරන නමුත් ඔවුන් දෙවියන් වහන්සේගේ ශුද්ධකම ධර්මිෂ්ඨකමින් සහ උන්වාහන්සේගේ ආධිපත්‍යය පිළිබඳව සැක සහිතව නිශ්ශබ්දව සිටිති. ඊට හේතුව වන්නේ දෙවියන් වහන්සේව සෙවීමට සැලකිල්ලට ගැනීම පහත මට්ටමකට පැවතීම සහ ඔවුන් තමන්ගේ පාපයෙන් සැබෑ ස්වභාවය ගැන අන්ධව සිටින නිසා ය.

සුභාරංචිය දේශනා කිරීම (ප්‍රකාශ කිරීම) තුල සැබෑ ලෙස දෙවියන් වහන්සේව දැනගැනීම විශාල ප්‍රදේශයක පැතිරීයාමට සැලැස්වීම කරුණු කොටගෙන අපි පාපයේ ස්වාභාවය අනාවරණය කල යුතුය. දෙවියන් වහන්සේගේ ගුණාංග ගැන සැලකිලිමත් වෙමින් ලබාදී තිබෙන උපදේශයන් අපි සම්පූර්ණයෙන්ම ප්‍රකාශ කර සිටිය යුතුය. විශේෂයෙන්ම ලෞකීක මනුෂ්‍යයන්ගේ පිළිගැනීමවත් ,ප්‍රසිද්ධියවත් බලාපොරොත්තු නොවිය යුතුය. දෙවියන් වහන්සේගේ ආධිපත්‍ය ශ්‍රේෂ්ඨත්වය ශුද්ධකම ධර්මිෂ්ඨකම සහ ප්‍රේමය ඇතිව ක්‍රියා කල යුතුය.

## දෙවියන් වහන්සේගේ ආධිපත්‍යයයි

අපි ජීවත්වෙන්න වූ කාලයේ මනුෂ්‍යයන් නිරතවෙන්නා වූ සියළු කාරණාවල විකෘති තත්ත්වයන් මැන බැලීමේ අවබෝධයකින් යුතුව අපි ක්‍රියා කල යුතුය. ලෞකික මානවවාදියා බලන්නේ පහළ තිබෙන දේ වන අතර පරිණාමය වී තිබෙන්නා වූ ප්‍රමාණය මත ඔහු උසස්කම දකින්නේය. ඊට වඩා ඉහළින් කිසිවක් ඔහු දකින්නේ සහ ඔහුට දැනෙන්නේ නැත. ඒ අනුව ඔහු රජුගේ වරදට විරුද්ධත්වයක් දක්වන්නේ නැත. කලින් නිශ්චය කරගනු නියමය පැහැදිලි කරමින් රජතුමා නීති සම්ප්‍රදකයා සහ පාලකයා ලෙස දකින්නේ ය. ඒ අතරම රජු සමඟ සමාන කිරීමට කිසිවෙකු නැති බව සිතීමෙන් තමාගේ ජීවිතය මුලාකරගෙන සැබෑ තත්වය පිළිබඳව අවබෝධයක් නැතිව, තමා ගැනම පුහු ආටෝපය ඇතිව,  නාස්පුඩු වල හුස්ම ඇති මනුෂ්‍යයාව විශ්වාස කරමින්, තණකොළ සුළඟට ගහගෙන යන්නාක් මෙන් සහ  මොහොතකින් නැති වී යන මීදුමක් මෙන් වන්නෝය. (යෙසායා 2 ඃ 22 , ගීතාවලිය 103 ඃ 15 - 16 , යාකොබ් 4 ඃ 4)

ආගමික මානවවාදියාද, ලෞකික මානවවාදියාට වඩා

6 පිටුවට

**"ආකාශය උන්වහන්සේගේ ධර්මිෂ්ටකම ප්‍රකාශ කරයි. සියළු මනුෂ්‍යය වර්ගයෝ උන්වහන්ස්ගේ මහිමය දුටුවෝය." (ගීතාවලිය 97 : 6)**

3 පිටවෙන්

# දෙවියන් වහන්සේගේ ගුණාංගවලට...

වැඩි වෙනසක් නැති ව සිටිති. එසේ වුවත් ඔහු සුභාරංචියට අනුකූල වූ තත්වයෙන් සැරසී සිටිති. එබැවින් අනිත් අයට වඩා තමන් වැදගත් යැයි යන හැඟීම ඔහු තුල උත්සන්න වී වර්තමාන දවස්වල පවතින මනෝ විද්‍යාව සමග සම්බන්ධ වෙමින් තමාගේ හැකියාවෙන් තමා අභිමතර්ථයෙන් බලපෑමක් ඇතිකල හැකිය යන කනගාටුදායක තත්වයට පත්ව සිටිති. ඒ තුලින් ඉතා නරක කාරණා නිර්මාණය වී ඇත. බොහෝ දේශකයන් එබඳුවූ වැරදි ලෙස කටයුතු කිරීමට සභාව පොළඹවමින් අවදානමට ලක් කරන්නෝය. එසේ වුවත් දෙවියන් වහන්සේ පිළිබඳව පොදුවේ පිළිගත් සාරධර්ම උගන්වති. දෙවියන් වහන්සේගේ මහිමය යටහත් මනුෂ්‍යයන්ට දැනෙන්නට සැලැස්වීමට අවශ්‍ය නිසා උන්වහන්සේ මනුෂ්‍යයාව ප්‍රතික්ෂේප කිරීමට වඩා ඔවුන්ට ප්‍රකාශ වීමට බලා සිටින සේක. ඒ අරුත් දෙවියන් වහන්සේගේ අරමුණු සහ සදාකාලික යහපත් වූ සතුට දැන් ප්‍රකාශ කිරීම මත සම්පූර්ණයෙන්ම රැඳී තිබෙන නිසා මානුෂ්‍යාගේ යහපත උදෙසා අතිශයින්ම සමීපවන්නේ නැතිව අපිව සම්පූර්ණ කිරීමට සහ පූර්ණ කිරීමට උන්වහන්සේට නොහැකිය. එසේවුවත් මෙම ප්‍රකාශයෙන් අතිශෝක්තියක් යැයි සිතීමට පුළුවන. ඉවැන්ජලිස්ත සෙනග මෙයින් අවංකව සැලකිල්ලට ගත යුත්තේ ලෝකයාට සැබැවින් ම ප්‍රකාශ කල යුතු මොනවාද සහ තමන් ප්‍රකාශ නොකරන්නේ මොනවාද කියා වන්නේය.

මෙම මානවවාදීන් වර්තමානයේ දී අපි ලෝකයට ප්‍රකාශ කරන්නාවූ සුභාරංචිය මත ක්‍රිස්තියානි ධර්මයට නැඹුරු වීම තුල විනාශ වන්නාවූ පුද්ගලයන්ගේ ජීවිත වලට යම් බලපෑමක් කර තිබේ. දෙවියන් වහන්සේ පිළිබඳව අපගේ අවබෝධය පහළ මට්ටමක පවතිද්දී අපට ඇහුම්කන් දෙන මිථ්‍යාදෘෂ්ඨිකයන් තුල නොකඩවා පවතින මිත්‍යාවන් අපගේ දේශනා කිරීම් තුලින් ඔවුන්ට වටහා දීමට අපට නුපුළුවන. ස්වාමීන් වහන්සේ කෙරෙහි භයවීම, දෙවියන් වහන්සේගේ මහිමයේ උතුම්කමෙන් පූර්ණ වීම, උන්වහන්සේගේ යහපත්කම උපරිමයෙන් දැනීම, උන්වහන්සේගේ පුද්ගලික කැමැත්ත දැනගැනීම වුවත් වැළකී යන්නේය. අපි සිතන්නාවූ ආකාරයෙන් පහතට වැටී සිටින නිසා සහ අපි ප්‍රකාශ කරන්නා වූ සාරධර්ම අපගේ පිළිතුරට පටහැනිව තිබෙන නිසා බොහෝ ඉවැන්ජලිස්ත කිතුණුවන් කිතුණු ධර්මයට අදාල සත්‍යතාවයන් වලට ගෞරව කිරීමට නොදැන සිටිති. මනුෂ්‍යාගේ ප්‍රධාන සහ උසස්ම බලාපොරොත්තුව විය යුත්තේ කුමක්ද.....? දෙවියන් වහන්සේව මහිමයට පත් කිරීම සහ සදාකාලික වූ උන්වහන්සේගේ ප්‍රීතිය සම්පූර්ණ කිරීමයි.

සියළුම ප්‍රකාශකයන් සහ ව්‍යාකූලත්වයන් නිරාකරණය කිරීමට අපට කළ හැකිව තිබෙන්නේ මොනවාද......? මෙම ක්‍රියාවලිය අපි සරලව ගත්තත් එය දුෂ්කරව තිබේ. ඔවුන් දේව වචනය තුලින් සොයාගන්නා වූ දෙවියන් වහන්සේගේ ගුණ අපේ ජීවිත වලින් ප්‍රකාශ කිරීමට අපි කැපවිය යුතුය. අපගේ කාලයේ මානවවාදීන්ගේ දර්ශනවාදය කරුණු කොටගෙන කපාඔප දැමූ, හැඩගැසුණු, සංස්කරණය වූ අය බවට පත්නොවීමට අපි වග බලා ගතයුතුය. දෙවියන් වහන්සේගේ ආරක්ෂාව සඳහා අපව නිර්මාණය කිරීමට උන් වහන්සේට අවශ්‍ය නොවන සේක. ශුද්ධ ලියවිල්ල තුල සඳහන් කර තිබෙන ප්‍රකාරයට අපි දෙවියන් වහන්සේ ව ප්‍රකාශ කරන්නේ නම් උන්වහන්සේ තමන් වහන්සේ වෙනුවෙන් නැගී සිටිනසේක. තමන් කෙරෙහිම ඇළුම්වූ මනුෂ්‍යයන් මධ්‍යයේ අපි සිටගත යුතුය. ඔවුන්ගේ විශ්වාසයන්ට අභියෝගකරමින් අපි ප්‍රකාශ කරන්නාවූ සත්‍යතාවයට ඔවුන්ගේ ඇස් යොමුකල යුතු ය. දෙවියන් වහන්සේ පමණක් ම සදාකාලික වෙනස් නොවන සහ අදෘශ්‍යමාන ස්වාමීන් වහන්සේ බව අපි ඔවුන්ට පැවසිය යුතුය.

**“මක්නිසාද ස්වාමීනි, ඔබ මුළු පොළොවට උතුම්සේක. ඔබ සියළු දෙවිවරුන්ට වඩා අතිශයින් උසස්ව සිටින සේක.”** (ගීතාවලිය 97 : 9) **“මක්නිසාද උසස්වූ, උත්කෘෂ්ඨවූ, සදාකාලයෙහි වසන්නාවූ, ශුද්ධය යන නාමය ඇති තැනැන් වහන්සේ මෙසේ කියනසේක. මම උසස්වූ, ශුද්ධවූ ස්ථානයෙහිද, යටහතුන්ගේ ආත්මය ප්‍රාණවත්කරන්ටත්, පොඩිවී සිටින්නන්ගේ සිත ප්‍රාණවත් කරන්ටත් තැළුණාවූ යටහත් ආත්මයක් ඇත්තා සමග වාසය කරමි.”** (යෙසායා 57 : 15) **“ඉදින් අමරණීය වූ, අදෘශ්‍යමානවූ, එකම දෙවිවූ, සදාකාල රජ්ජුරුවන් වහන්සේට, ගෞරවයද, තේජසද, සදාකාලේටම වේවා. ආමේන්”**

(1 තිමෝති 1 : 17) අන්‍යජාතීන් මෙන් කලයකින් වැටෙන දිය බින්දුවක් සහ තරාදියෙහි තිබෙන දූවලි පිසදමාන්නාක් මෙන් සිදුවීමට පෙර අපි ඔවුන්ට අනතුරු ඇඟවිය යුතුය. (යෙසායා 40 : 15 - 18) මහත්තත්වයද, පරාක්‍රමයද, තේජසද, ජයද, මහිමයද, දෙවියන් වහන්සේට අයිති බවත්, ස්වර්ගයෙත්, පොළොවෙත් ඇති සියල්ල උන්වහන්සේගේ බවත් ස්ථිර ලෙස අවබෝධ කරගැනීමට අපි ඔවුන්ව යොමුකල යුතුය. (1 ලේකම් 29 : 11) සියල්ල උන්වහන්සේ කෙරෙන්, උන්වහන්සේ කරුණු කොට ගෙන සහ උන්වහන්සේ උදෙසා වන සේක. (රෝම 11 : 36) දෙවියන් වහන්සේ අපගේ පාපයට විරුද්ධව සිටින බව පැහැදිලි සහ නිවැරදි අපි ප්‍රකාශ කල යුතුය. මක්නිසාද සාතන්ට සහ අපගේ පාපයට වඩා දෙවියන් වහන්සේ බලවන්තව සිටින සේක.

## දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය

සැකයක් නැතිව ලෞකික මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිගෙන තිබෙන්නේ ඉතා සුළු වශයෙනි. මෙම විශේෂිත වූ සත්‍යතාවය තුල නූතන බටහිර පුද්ගලවාදය, ස්වයං පාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය පාරිශුද්ධ තේමාවන් ලෙස සලකමින් ඊට ආවේනික යුක්තිය සලසමින් තමන්ම සත්‍ය ඉටුකිරීමට උත්සහා දරති. එසේ වුවත් මෙම උදාර තේමාවන් මනුෂ්‍යයාගේ රාජ්‍යය පාලනයේ සීමාසහිත බව පැහැදිලිකර දෙන්නේය. දෙවියන් වහන්සේගේ රාජ්‍ය පාලනයේ උන්වහන්සේගේ ක්‍රියාකාරකම් සීමා කිරීමට විරුද්ධව අපි නිරතුරුවම ආරක්ෂා වීමට ක්‍රියාකල යුතුය. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සිංහාසනය ස්වර්ගයෙහි පිහිටුවා තිබෙන බවත්,, උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයේ නියමයන් සියල්ලට ඉහළින් තිබෙන බවත් ශුද්ධ ලියවිල්ලේ හේතු සාධක සහිතව ප්‍රකාශ කර තිබෙන සේක. (ගීතාවලිය 103 : 19) එහි උන්වහන්සේගේ රාජ්‍යයේ සීමාවක් නැති අතර උන්වහන්සේගේ සිමා රහිත ක්‍රියාවන් සැක කරන කිසිවෙකුත් එහි නොමැත. ජීවමාන සියල්ලන්ගේ පැවැත්ම, මවන ලද සියළුම දේවල් සහ ඉතිහාසයේ සියළුම සිදුවීම් උන්වහන්සේටය. දෙවියන් වහන්සේ කමැති වූ සියල්ල උන්වහන්සේ ඉටුකරන සේක. (ගීතාවලිය 115 : 3, 135 : 6) උන්වහන්සේගේ කැමැත්තේ මන්ත්‍රණය ප්‍රකාරයට සියළු දේ කරන සේක. උන්වහන්සේව හැර වීමට කිසිවෙකුට නුපුළුවන. (එපිස 1 : 11, යෝබ් 23 : 13) නසන්නෙත් ජීවත්කරන්නෙත් උන්වහන්සේය.(1 සාමුවෙල් 2 : 6) උන්වහන්සේ සමාදානය දෙන්නාවූ, විපත උපදවන්නාවූ තැනන්වහන්සේය. (යෙසාය 45 : 7) උන්වහන්සේගේ අත්වල පහර වැළැක්වීමට හෝ ඔබවහන්සේ මේ කර තිබෙන්නේ මොනවාදැයි ඇසීමට කිසිවෙකුට නුපුළුවන. (දනියෙල් 4 : 34 - 35) උන්වහන්සේගේ මන්ත්‍රණය සදකාලයටද, උන්වහන්සේගේ සිතේ කල්පනාව පරම්පරාවෙන් පරම්පරාවටද, පවතින්නේය. (ගීතාවලිය 33 : 11) ස්වාමින් වහන්සේට විරුද්ධව ප්‍රඥාවක්වත්, නුවණක්වත්, මන්ත්‍රණයක්වත් නැත. (හිතෝපදේශ 21 : 30) දෙවියන් වහන්සේගේ ස්වාධිපත්‍යය සදාකාලිකව පවතින ස්වාධිපත්‍යයකි. (දනියෙල් 4 : 34 - 35 ) එහි ආරක්ෂාව වෙනස් කිරීමට සහ උන්වහන්සේගේ කාර්යය වෙනකෙනෙකුට ඉටු කිරීමට නොකකිය. උන්වහන්සේගේ සැමවිටම අප සමග කටයුතු කරන්නාවූ ස්වාමින් වහන්සේය.

මනුෂ්‍යයා තමන් පව්කරුවන් බව අවබෝධ කරගත් විට දෙවියන් වහන්සේගේ දෙවත්වයට විරුද්ධව හෝ කුඩා ප්‍රදේශක හෝ පවතින උන්වහන්සේගේ ආධිපත්‍යයට විරුද්ධව කැරළිගසන්නේ නැතිව උන්වහන්සේ මනුෂ්‍යාගේ සියළු දෙවිවරුන්ට වඩා ඉහළින් සිටින රජතුමාණෝ බව තේරුම් ගනිති. ස්වර්ගයෙහිත්, පොළොවෙහිත්, උන්වහන්සේගේ ආධිපත්‍යය පවතින සේක. උන්වහන්සේ රජුන්ගේ රජතුමා සහ ස්වාමින්ගේ ස්වාමිතුමාය. (ගීතාවලිය 95 : 3, ක්‍රියා 17 : 24, 1 තිමෝති 6 : 15 - 16) සියළුම පාප, වචනයෙන් විශ්වය මැව්වාවූ තැනන්වහන්සේට විරුද්ධව සහ උන්වහන්සේගේ ආධිපත්‍යයට විරුද්ධව පහසුවෙන් සහ නිදහසේ ප්‍රකාශ වන්නේය. රාත්‍රී අහසේ දිදුලන පිණිස උන්වහන්සේගේ තාරකාවන්ට අණකර ඒවා නියමිත ස්ථානයේ තබන සේක. උන්වහන්සේගේ වචන කරුණුකොටගෙන ග්‍රහලෝකවලට වක්‍රාකාරව ගමන් කරන පිණිස නියෝග කර තිබෙන සේක. කඳු ඉහළින් පැවතිමටත්, මිටියාවත් පහළින් පිහිටිමටත් සලස්වා තිබෙන සේක. ඒවා උන්වහන්සේට භියෙන් යුතුව කීකරු වන්නෝය. මුහුද එහි සීමාව පසුකර නොඑන පිණිස උන්වහන්සේ වෙරළ තබා තිබෙන සේක.

සුභාරංචිය දේශනා කරන්නන් ලෙස දෙවියන් වහන්සේගේ ස්වාදිපත්‍යය පැහැදිලිකර දෙමින්, මනුෂ්‍යයාගේ පාපයේ දුෂ්ටවූ අපරාධ සෝදිසි කර ඔවුන්ගේ හදවත් වැටී තිබෙන්නාවූ විනාශකාර ස්වභාවය අනාවරණය කල යුතුය. කෙසේවෙතත්, අපි දෙවියන් වහන්සේව දැනගැනීමේ පූර්ණත්වය සහ අපට ඇහුම්කන් දෙන අයට උන්වහන්සේව දැනගැනීමේ සත්‍යතාවය බෙදීම එපා කරන්නේ නම් ඊළඟට අපි ඔවුන්ට අ යුක්තක් කර සහ ඔවුන්ව වැරදිකරුවන් කර රූප නමස්කාරයට යොමුකරවන්නේය. ඊශ්‍රායෙල් සෙනග දෙවියන් වහන්සේට භයවන පිණිස ශුද්ධ ලියවිල්ල තුල උන්වහන්සේව අනාවරණය කර තිබෙන සේක. (නික්මයාම 20 : 20) දෙවියන් වහන්සේගේ පූර්ණ මන්ත්‍රණය තුල අපි උන්වහන්සේව අණාවරණය කරමින් දේශනා කිරිමට සැලකිලිමත් වන විට සියළු ජාතීන් කෙරෙහි මහත් වූ භය පැමිණ ඔවුන් ගැළවීමට පැමිණෙනවා ඇත. ඔවුන් දෙවියන් වහන්සේ වෙතට හැරී ඒම සහ ඔවුන් තමන්ගේ පාපයේ භයානක ස්වාභවය අවබෝධ කරගෙන යේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සුභාරංචිය තුල ඊට ප්‍රතිකාරය දකිනවා ඇත.

7 පිටුවට

**“මෙසේ ඔබගේ බලයත්, ඔබගේ මහිමයත් දකින පිණිස ශුද්ධස්ථානයේදී ඔබ දෙස බලා සිටියෙමි.” (ගීතාවලිය 63 : 2)**

6 පිටුවෙන්

# දෙවියන් වහන්සේගේ ගුණාංගවලට...

## දෙවියන් වහන්සේගේ ශුද්ධකම

පරණ ගිවිසුම තුලත්, අළුත් ගිවිසුම තුලත් දෙවියන් වහන්සේගේ, ශුද්ධවූ..., ශුද්ධවූ..., ශුද්ධවූ..., දෙවියන් වහන්සේ බව ප්‍රකාශ කර තිබෙන සේක. (යෙසායා 6 ඃ 3, එළිදරව් 4 ඃ 8) තුන්පාරක්ම එකම දේ ප්‍රකාශ කිරිම හෙබ්‍රෙව් භාෂාව තුල නිතරම අති උතුම්වූ (ඉතා උසස්ම තත්වයේ) ශක්තිය ප්‍රකාශ කරනු ලබයි. ශුද්ධකම පමණක් උන්වහන්සේගේ එකම ස්වාභවය නොවේ. නමුත් අනෙකුත් සියළුම දිව්‍යමය ගුණාංග පිළිබඳවත් පැහැදිලිව සඳහන් කර තිබෙන අතර ඒවා අවබෝධ කරගත යුතුය. සියලු දේවලට ඉහලින් මනුෂ්‍යයන් දෙවියන් වහන්සේගේ ශුද්ධකම දැනගත යුතුයි. දෙවියන් වහන්සේගේ මෙම ස්වභාවය මනුෂ්‍යන් අවබෝධ කරගැනීම ස්ථිර සාධකයක් වන්නේ ඇයි....? එයින් ඔවුන් දෙවියන් වහන්සේ පිළිබදව, ගැළවීම පිළිබදව සහ සියලු දේවල යථාර්තය නියමාකාරයෙන් අවබෝධ කරගනිති. "ශුද්ධ තැනැන්වහන්සේව දැනගැනීම නුවණ වන බව" හිතෝපදේශයේ සදහන්වේ. (හිතෝපදේශ 9 ඃ 10) දෙවියන් වහන්සේගේ ශුද්ධකම වන මෙම එක ස්වභාවය දැන නොසිටීමේ බරපතලකම වන්නේ, ශුද්ධකම නොදැන සිටින්නේ නම් දෙවියන් වහන්සේව දැන නොසිටීමයි. ඒ අතරම උන්වහන්සේගේ ශුද්ධකම නොදැන සිටින්නේ නම් උන්වහන්සේගේ අනෙකුත් සියලුම දිව්‍යමය ස්වභාවයෙන් සහ ක්‍රියාවන් පිළිබදව වැරදි අර්ථකථනයන් ලබාදීමට තමන්ම විවෘතව සිටින්නේය. එපමණක් නොව දෙවියන් වහන්සේ ශුද්ධ දෙවියන් වහන්සේ බව නොදැන සිටින විට මනුෂ්‍යන්ව විශ්වාසදායි නොවන සහ විනාශකාරී මාර්ගයක ගෙනයනවා ඇත. ඒ අනුව මනුෂ්‍යයන් ඔවුන්ගේ පාපයේ අප්‍රසන්නකම අවබෝධකර ගැනීමට නම් ඊට ප්‍රථමයෙන් දෙවියන් වහන්සේගේ ශුද්ධකමේ ස්වභාවය අවබෝධ කරගත යුතුය.

හෙබ්‍රෙව් භාෂාවේ **"කාඩොෂ්"** යන වචනයෙන් ශුද්ධකම නැමති වචනය නිර්මාණය වී තිබේ. එහි අදහස වෙන් වූ , කැලලක් නැති, වෙනම තත්වයක් හෝ පොදුවේ පරිහරණය කල නොහැකි යනුයි. ශුද්ධකම යන වචනයෙන් දෙවියන් වහන්සේ පිළිබදව වැදගත් සත්‍යතාවයන් දෙකක් හඟවා දෙන බව මතකයේ තබාගන්න. පළමුවෙනුව, දෙවියන් වහන්සේගේ ශුද්ධකමෙන් උන්වහන්සේගේ උත්කෘෂ්ඨ බව (භෞතික සීමාවන්ට යටත් නොවන බව) සදහන් කරගන්නේය. මැවුම්කරුවාණන් ලෙස උන්වහන්සේ, තමන්වහන්සේගේ මුළු මැවිල්ලට වඩා ඉහලින් සිටිනසේක. උන්වහන්සේ සියළුම දේ මැවූ බව, පෝෂණයකරන බව උසුලසිටිනබව (නඩත්තු කරන බව) පැහැදිලි පෙනෙන්නේය. දෙවියන් වහන්සේගේ ශුද්ධකම කරුණුකොටගෙන අනිත් සියල්ලෙන් වෙන්ව සිටින අතරතුර සියල්ලේදී උන්වහන්සේ සීමාරහිතව සිටිනසේක. (උන්වහන්සේ බලවත්වූ දෙවියන් වහන්සේ වනසේක.) එමනිසා ගුණාත්මකබවින් දෙවියන් වහන්සේ සම්පුර්ණයෙන්ම වෙනස්ව සිටින සේක. උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය අමතක නොකරන්න. උන්වහන්සේ ස්වර්ගයේත්, පොළොවේත් පවතින සියළුම දේවල මැවුම්කරුවාණෝය. දෙවියන් වහන්සේ කිසිවෙකුගේ සහයක් නැතිව පවතින්නාවූ, වෙන්ව සිටින්නාවූ, උත්කෘෂ්ඨවූ, සමීපවිය (ළඟාවිය) නොහැකි දෙවියන් වහන්සේ මෙන් ශුද්ධව සිටින්නාවූ කෙනෙක් නොමැත. (1 සාමුවෙල් 2 ඃ 2) උන්වහන්සේට සමානකල හැකි කිසිවෙක් නොමැත. එමනිසා මෝසෙස් සහ ඊශ්‍රයෙල් සෙනග මෙසේ ගායනා කළෝය. **"ස්වාමින් වහන්ස, දෙවිවරුන් අතරේ ඔබට සමාන කවුද...? ශුද්ධකමින් මහිමවත්වූ, ප්‍රශංසා වලින් භයංකාරවූ පුදුම දේ කරන්නා වූ ඔබ සමාන කවුද....? "**(නික්මයාම 15 ඃ 11)

දෙවනුව, උන්වහන්සේගේ මැවිල්ලේ සදාචාරය කෙළෙසි තිබීමට ඉහළින් උන්වහන්සේගේ උත්කෘෂ්ඨකම තිබෙන බව, ශුද්ධකම තුලින් පැහැදිලිව සදහන්කර ඇත. පාපිෂ්ඨ සහ අසභය (මිත්‍යා දෘෂඨික) සියළුම දේවලින් උන්වහන්සේ වෙන්ව සිටිනසේක. උන්වහන්සේ නිකලැල්ව සහ පවිත්‍රව සිටින සේක. උන්වහන්සේ ආලෝකයව සිටින අතර උන්වහන්සේ තුල කිසි අන්ධකාරයක් නොමැත. (1 යොහාන් 1 ඃ 5) උන්වහන්සේ ආලෝකයේ පියාණන් වහන්සේය. උන්වහන්සේ තුල වෙනස්වීමක්වත් හැරීමේ ජයාවක්වත් නැත. (යාකොබ් 1 ඃ 17) උන්වහන්සේ නපුරෙන් පරීක්ෂා නොකරන සේක. (යාකොබ් 1 ඃ 13) සියළුම පාපයන් උන්වහන්සේ ද්වේශ කරන සේක. පිළිකුල් සහගත කාරණාවන් උන්වහන්සේගේ දැඩි අප්‍රසාදය සහ පිළිකුල් ඇතිකරගන්නේය. අයුතු ලෙස (අසාධාරණය ලෙස) කටයුතු කරන සියළු දෙනා උන්වහන්සේගේ සිංහාසනය ඉදිරියේදීද්වේශ කරනු ලබන සේක. අධර්මිෂ්ටකම් කරන සියල්ලන්ට විරුද්ධව උන්වහන්සේගේ මුහුණ හරවන සේක. (ද්වතිය කථාව 26 ඃ 16, ගීතාවලිය 5 ඃ 4) එමනිසා ශුද්ධවූ සහ අවංකවූ මනුෂ්‍යයන් දෙවියන් වහන්සේ ඉදිරියේ සම්පුර්ණන්යෙන්ම වැදවැටී උන්වහන්සේට මොරගසනවිට උන්වහන්සේ ඔවුන් දෙස බලා ඔවුන්ව පිළිගත් බව දේව වචනයේ සදහන්වේ. **"එවිට මම කථාකොට, අහෝ මට දුක්වේ. මක්නිසාද මම විනාශය විය.කුමක් හෙයින්ද අපවිත්‍ර තොල් ඇති මනුෂ්‍යයෙක්ව සිටින්නාවූ, අපවිත්‍ර තොල් ඇති සෙනගක් අතරේ වසන්නාවූ මම සේනාවල ස්වාමිවූ රජ්ජුරුවන් මාගේ ඇස්වලින් දුටුවෙමියි කීමි."**
(යෙසයා 6 ඃ 5)

එහිදී මනුෂ්‍යයාගේ ගැළවීම තුල සමහර කාරණා තර්කානුකූලව වර්ධනය වෙමින් ඉදිරියට යන්නේය. ඔවුන් ගැළවීම ලැබීමට පෙර තමුන් මුලාවී සිටිය බව අවබෝධ කරගත යුතුය. අවසානවශයෙන් ඔවුන්ගේ පාපිෂ්ඨ ස්වභාවයේ බරපතලකම සම්පූර්ණයෙන්ම අවබෝධ කරගැනීමට පෙර දෙවියන් වහන්සේ ශුද්ධ බව ඔවුන් අවබෝධ කරගත යුතුය. මෙම සත්‍යතාවයේ ආලෝකය තුල අපි ඔවුන්ට ශුද්ධ තැනන් වහන්සේව පහදාදීම අතපසු කරනවිට (පැහැරහරිනවිට, නොසලකා හරින විට) පැහැදිලිවම අපි ඔවුන්ව ඔවුන්ගේම පාපයේ රදවා තබාගන්නා අතර ඔවුන් එහි (පාපයේ) පැවතීම පිළිබදවද එකග වන්නෙමු. එය මනුෂ්‍යයාට කරන යහපතක් නොවේ. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සුභාරංචිය තදින් ප්‍රකාශ කරමින් මනුෂ්‍යයා විසින් දෙවියන් වහන්සේගේ නාමය උතුම්කොට සැලකීමට ඉගෙන ගන්නාවූ ප්‍රමාණයට හෝ උන්වහන්සේගේ නාමය ශුද්ධ ලෙස ගෞරවනීයව සලකන්නාවූ ප්‍රමාණයට පමණක් දේව රාජ්‍යය වර්ධනය වන බව පැවසුසේක. (මතෙව් 6 ඃ 9) එබැවින් සුභාරංචිය දේශනා කරද්දී දෙවියන් වහන්සේගේ ශුද්ධකමේ පවතින්නේ නැතිනම් ඕනෑම තත්වයක් (වාතාවරණයක්) යටතේ විශ්වාසවන්තව එය ඉටුකල නොහැකිවේ.

## දෙවියන් වහන්ස්ගේ ධර්මිශ්ඨකම

හෙබ්‍රෙව් භාෂාවේ **"ස්ඇඩික්"** සහ ග්‍රීක් භාෂාවේ **"ඩීක්යෝස්"** යන වචන පරිවර්තන කිරීම කරුණු කොටගෙන ධර්මිශ්ඨකම නමැති වචනය පැමිණ ඇත. හෙබ්‍රෙව් සහ ග්‍රීක් වචන දෙකෙන්ම දෙවියන් වහන්සේගේ සාධාරණ බව, නිවැරදි බව හෝ උන්වහන්සේගේ යුක්ති සහගත බවේ විශිෂ්ඨත්වය හඟවා දෙන්නේය. ශුද්ධ ලියවිල්ලේ සදහන් වන පරිදි ධර්මිශ්ඨකම නිකම්ම දෙවියන් වහන්සේගේ තීරණයක් හෝ ක්‍රියා කිරීමක් නොව නමුත් එය උන්වහන්සේගේ අනිවාර්යිය ස්වාභාවය වනසේක. උන්වහන්සේ ධර්මිශ්ඨ වූ දෙවියන් වහන්සේ වනසේක. උන්වහන්සේගේ ධර්මිශ්ඨකම සදාකාලයටම පවතින අතර උන්වහන්සේ වෙනස් නොවන සේක. (ගීතාවලිය 7 ඃ 9, 119 ඃ 142) දෙවියන් වහන්සේ විශ්වාසවන්ත දෙවියන් වහන්සේ වන අතර උන්වහන්සේ නිවැරදි දේ වෙනස් නොකරන සේක. (යෝබ් 8 ඃ 3) දෙවියන් වහන්සේ, උන්වහන්සේ සමග සිටින සියල්ලන් තුල ක්‍රියාකරන සේක. ඒ අනුව උන්වහන්සේගේ සියළුම ක්‍රියාවන් සම්පූර්ණයෙන්ම සහ උන්වහන්සේගේ මාර්ග යුක්ති සහගතව තිබෙන සේක. (ද්විතිය කතාව 32 ඃ 4)

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ මැවිල්ල සමග කටයුතු කරද්දී විශේෂයෙන් උන්වහන්සේගේ ධර්මිශ්ඨකමේ ගුණාංග ප්‍රකාශ කරමින් ක්‍රියාකරන සේක. දෙවියන් වහන්සේගේ සිංහාසනය සහ උන්වහන්සේගේ නියෝග හිතුවක්කාරකම, අයුක්තිය, පක්ෂභජනය මත පිහිටා නොමැති බවත් උන්වහන්සේගේ නියෝග සහ සිංහාසනය ධර්මිශ්ඨකමට සහ යුක්තිය මත පිහිටා තිබෙන බවත් දේව වචනයේ අපට සහතික කර ඇත. (ගීතාවලිය 89 ඃ 14) දෙවියන් වහන්සේ ධර්මිශ්ඨව පවතින සේක. උන්වහන්සේ ධර්මිශ්ඨකම ප්‍රේමකරන සේක. එමෙන්ම උන්වහන්සේ අධර්මිශ්ඨකමට සම්පූර්ණයෙන්ම අප්‍රසන්නව සිටිනසේක. (ගීතාවලිය 11 ඃ 7, 5 ඃ 5) ඒ අනුව යුක්ති සහගත (ධර්මිෂ්ඨ) ස්වාභාවය නැතිව හෝ, මනුෂ්‍යයාගේ උදාසීන චරිත ගුණාංග සමග ක්‍රියාකිරීමට උන්වහන්සේට නුපුළුවන. එමනිසා, මුරණ්ඩුකම (කැරළිකාරකම) සමග මිශ්‍රනොකර ඔවුන්ව විනිශ්චය කරනසේක. ගීතිකා කරුවා මෙලෙස ප්‍රකාශ කර තිබෙන්නේ එම නිසාය.**"එහෙත් ස්වාමින් වහන්සේ සදාකල්ම රජව වැඩහිදින සේක. උන්වහන්සේ තමන් සිංහාසනය විනිශ්චය පිණිස පිළියෙළ කල සේක. උන්වහන්සේ ධර්මිශ්ඨකමින් ලෝකයා විනිශ්චය කරනසේක. අවංකකමින් ජනයන්ට යුක්තිය සලස්වා දෙන සේක."** (ගීතාවලිය 9 ඃ 7 - 8)

මෙම සත්‍යතාවය මත දෙවියන් වහන්සේගේ විනිශ්චය දවසේදීත් සියළුම මනුෂ්‍යන්ව ධර්මිශ්ඨ ලෙස විනිශ්චය කරන බව අපට සහතිකකර තිබෙන සේක. උන්වහන්සේ අධර්මිශ්ඨකම පහකර උන්වහන්සේගේ සාධාරණත්වය ප්‍රකාශ කරන සේක. විනිශ්චයේදී උන්වහන්සේ උසස්ව සිටින අතර ධර්මිශ්ඨකම තුල ශුද්ධකම ප්‍රකාශ කරමින් ක්‍රියා කරන සේක. (යෙසායා 5 ඃ 16) එහිදී උන්වහන්සේගේ ක්‍රියාවන් වලට වරද තබමින් උන්වහන්සේට විරුද්ධවීමට කිසිවෙකුට නොහැකි වේ. දෙවියන් වහන්සේ ධර්මිශ්ඨ දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ විනිශ්චය කිසිදු අඩුවක් නොමැතිව සම්පූර්ණව තිබේ. (යෝබ් 36 ඃ 23)

යහපත හා නපුර යන දෙකම දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ටකමින් සහ යුක්තියෙන් විනිශ්චය කරන

8 පිටුවට

Reg. No: QD/NEWS/15/2022
30/7,A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.



7 පිටුවෙන්

# දෙවියන් වහන්සේගේ ගුණාංගවලට...

බව මතකයේ තබාගන්න. සර්වබලධාරී දෙවියන් වහන්සේගේ ධර්මිශ්ඨකම සහ යුක්තිය බලයෙන් පූර්ණව තිබෙන බව අපට ඇති යහපත් පණිවිඩයයි. නපුරට හෝ වෙනත් කිසිදු බලයකට දෙවියන් වහන්සේව බිය වැද්දීමට නුපුළුවන. දෙවියන් වහන්සේ ධර්මිශ්ඨකම සිටින බැවින් අපිත් ධර්මිශ්ඨ දේ කල යුතුය.

තවත් ආකාරයකින් පවසන්නේ නම් වර්තමානයේදී ද ධර්මිෂ්ඨ දෙවියන් වහන්සේ මනුෂ්‍යාගේ ප්‍රශ්ණ උදෙසා මහත් ලෙස ක්‍රියාකරන සේක. මේ හේතුවෙන් තර්කානුකුලව අවසාන නිගමනයකට පැමිණිය හැකිය. මෙහිදී පොරොන්දු කිහිපයක් අපට ලබාදී තිබෙන සේක.

පළමුවන පොරොන්දුව නම් ..., දෙවියන් වහන්සේ මැවුම්කරුවාණන් සහ යහපත, ධර්මිශ්ඨකම ඇතිව විශ්වයේ සර්වබලධාරී දෙවියන් වහන්සේව සිටිනසේක.

දෙවන පොරොන්දුව නම් ..., ධර්මිශ්ඨ සහ යහපත් දෙවියන් වහන්සේ නපුරට සහ අධර්මිශ්ඨකමට විරුද්ධව විනිශ්චය ගෙනයන සේක.

තුන්වන පොරොන්දුව නම්..., සියළු මනුෂ්‍යයන් නපුරේ සහ අධර්මිශ්ඨකමේ වරදකරුවන් බවට පත්වී ඇත.

අවසාන නිගමනය වන්නේ ..., එබැවින් සියළු මනුෂ්‍යයන්ට විරුද්ධව දෙවියන් වහන්සේගේ විනිශ්චය පැමිණේ.

ධර්මිශ්ඨකමට යටහත්වන මනුෂ්‍යයන් ධර්මිශ්ඨ දෙවියන් වහන්සේගේ යහපත් පණිවිඩය වන්නේ උන්වහන්සේ අධර්මිශ්ඨකම පලවාහරින බව වනසේක. මෙම සත්‍යතාවය හිතෝපදේශයේ තහවුරු කර ඇත. **"යුක්තිය කිරීම ධර්මිෂ්ඨයාට ප්‍රීතියක්ව, අයුතුකම් කරන්නන්ට විනාශයක්ව තිබේ."** (හිතෝපදේශ 21 : 15) දෙවියන් වහන්සේ මෙන් අපි ධර්මිශ්ඨව සිටින්නේ නම්, ධර්මිශ්ඨයන්ට ඇති ඊලග පණිවිඩය වන්නේ දෙවියන් වහන්සේගේ විනිශ්චය ප්‍රීතියක් වන බවයි. කෙසේ වෙතත් ධර්මිෂ්ටකමකම් කරන කිසිවෙක් නැත. එසේය, එක්කෙනෙක්වත් නැත. (රෝම 3 : 10) එබැවින් බලාපොරොත්තු වන්නාවූ දෙවියන් වහන්සේගේ ධර්මිශ්ඨකමේ විනිශ්චය සියළු මනුෂ්‍යයන්ට බිය උපදවන්නකි. එමෙන්ම දෙවියන් වහන්සේ මැදහත් කරුවෙක්ව සොයන සේක. පැමිණෙන්නාවූ විනිශ්චයේ පණිවිඩය උදෙසා බොහෝ මනුෂ්‍යන් ක්‍රියා නොකිරීම හේතුවෙන් අවසාන තීන්දුව අනුගමනය කරන්නාවූ අයව පමණක් අපට ඒ සදහා යොමුකළ හැකිය. ප්‍රථමයෙන්, මනුෂ්‍යන්ගේ හෘදය සාක්ෂිය දැඩිවී සහ ඔවුන් විශ්වාස කරන්නාවූ සියළු කාරණා වලින් මුළාවී ඇත. දෙවනුව, අනිත් අයට වඩා තමන් බොහෝ ධර්මිශ්ඨ යැයි ඔවුන් සිතති. තුන්වෙනුව, දෙවියන් වහන්සේ ධර්මිශ්ඨකමෙන් අඩුව සිටින බව ඔවුන් සිතකි. හතරවෙනුව, ධර්මිශ්ඨකම වැනි මාතෘකාවන් ඔවුන් නොසලකා හරිති. මක්නිසාද ඉවන්ජලිස්ත දේශනාකුඩුවල ඒවා ගැන ප්‍රකාශ කරනු ලබන්නේ කලාතුරකිනි.

ලෝකයේ බොහෝ සමාජ සංස්කෘතීන් අතර විනිශ්චය (යුක්තිය) වෙනුවෙන් රෙදිකඩකින් දෑස්වැසූ, තරාදියක් අතේ ඇති කාන්තාවකගේ රුවක් නිර්මාණය කර ඇත. එයින් අපේක්ෂා කරන්නේ අල්ලස් ගැනීම හෝ දීම සහ පක්ෂග්‍රාහිවීම යුක්තිය අන්ධකරන බව හැගවීමයි. එසේවුවත්, පාපයට වැටුනාවූ මනුෂ්‍යන් උතුම් නොවන සමහර කාරණා සාක්ෂි සහිතව ප්‍රදර්ශනය කරන්නේය. අපි යුක්තියට, ධර්මිශ්ඨකම සාධාරණත්වයට අන්ධව සිටිනවාද ?. අපි පාපිෂ්ඨ මනුෂ්‍යයන් මෙන් හොර තරාදියක් සහ වැරදි (හොර) කලන්පඩි ඇතිව සිටිනවාද.... ? (හිතෝපදේශ 11 : 1) අපගේ අසල් වැසියන්ට ඉතා වැදගත් කාරණා අපි ප්‍රකාශ කාරණා නමුත් ඒ අතරම අපගේ ජීවිතවලින් ඔවුන්ට ඉත්මතුවී පෙනෙන්නට සලස්වා තිබෙන්නේ අන්තරය ගැන අවබෝධයක් නොමැතිව කටයුතු කරන ස්වභාවයයි.

(මතෙව් 7 : 3 - 4) තමන්ගේම සෙනගගෙන් කොල්ල කන්නා වූ ඒකාධිපති දේශපාලනඥයන්ට විරුද්ධව අපි චෝදනා කරන්නෙමු. මුදල්වලට, බලයට කෑදරව සිටින ඒකාබද්ධ සංවිධාන වලට විරුද්ධ කැපී පෙනෙන වෙනසක් නොමැතිව සිටින බව නොදකිති. එහිදී ඔවුන් සහ අප අතර තිබෙන දූෂිතබවේ ප්‍රමාණය පමණක් වෙනස්ව තිබේ. අපි සොරාගත් රොටි බොහෝ සෙයින් ආහාරයට ගෙන කට පිසදමා ගෙන අපි කිසි වැරැද්දක් නොකළෙමු යැයි කියති. මේ ලෝකයේ පව්කරුවන්ට විරුධව දිව්‍යමය විනිශ්චය පැමිණෙන බව ප්‍රකාශ කිරීම අවබෝධකරගැනීමට අපි අසමත්වන විට (අපොහොසත් වනවිට) අපගේම හිසමතට විනිශ්චය රැගෙන එන්නෙමු. පොදුවේ අප සියළු දෙනාම වරදකරුවන් බව ශුද්ධලියවිල්ලේ අපට විරුද්ධව සදහන්ව තිබීම පිළිබදව අපි තැකීමක් නැතිව සිටින්නෙමු. **"ධර්මිෂ්ට කෙනෙක් නැත. එසේය, එක්කෙනෙක්වත් නැත."** (රෝම 3 : 10)

සුභාරංචිය දේශනාකරනන් ලෙස අපි දෙවියන් වහන්සේගේ ධර්මිශ්ඨකම අනාවරණය කලයුතුය. ඒ අනුව අපි මනුෂ්‍යයාගේ අධර්මිශ්ඨකම හෙළිදරව් කල යුතුය. දෙවියන් වහන්සේගේ ධර්මිශ්ඨකම සිථිර ලෙස පෙන්වා දෙමින් දෙවියන් වහන්සේ තුල උන්වහන්සේගේ සම්පූර්ණත්වයට සුළු වශයෙන්වත් නුසුදුසු සහ ප්‍රතික්ෂේප වන්නාවූ (දෝෂාරෝපණයට ලක්වන්නාවූ) කිසිවක් නොමැති බව අපි තහවුරු කල යුතුය. අපේ පළමු දෙමව්පියන් (ආදම් සහ ඒව) කලාවූ එක් අධර්මිශ්ඨ වූ ක්‍රියාවන් නිසා සෑම මනුෂ්‍යයෙක්ම දෝෂාරෝපණයට හසුවූ බවත් මුළු මැවිල්ලම නැවත හරිගැස්විය නොහැකි ව්‍යකුලත්වයකට ගොදුරුවූ බවත් මනුෂ්‍යන් අවබෝධ කරගැනීම අපි අපේක්ෂා කල යුතුය. (රෝම 5 : 12 - 19) ගණන් කල නොහැකි තරම් ප්‍රමාණයක් පවතින්නාවූ නුසුදුසු වූ තමන්ගේ අධර්මිශ්ඨ වූ ක්‍රියාවන් අවබෝධ කරගැනීම කරුණු කොටගෙන පමණක් මනුෂ්‍යන්ට එයින් මිදී දෙවියන් වහන්සේගේ විශිෂ්ඨ වූ සම්බන්ධතාවය මත පදනම් වී ගුණයහපත්කම් සහ විශිෂ්ඨත්වයේ හිමිකරගැනීමට හැකිවන්නේය. දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ වාසය කිරීමට කලයුතු මොනවාදැයි මනුෂ්‍යයන් අපෙන් අසනවිට අපගේ පිළිතුර ස්ථිරව සහ නිවැරදි තිබිය යුතුය. මනුෂයෙක් දෙවියන් වහන්සේ සමග සම්බන්ධතාවය ඇතිව සිටීමට සොයන්නේ නම්, ඊළගට දෙවියන් වහන්සේ ඔවුන්ගෙන් එක් දෙයක් ඉල්ලා සිටිනසේක. එනම් කැළලක් නැතිව සදාචාර සම්පන්නව ජීවත්වීම හෝ ඔවුන්ගේ ජීවිතයේ කිසිදු අවස්ථාවකදී අසාර්ථක නොවීම වන සේක. අපට ඇහුම්කන් දෙන්නාවූ අයට එවැනි කාරණා කිරීමට යොමුවිය නොහැකිව සිටින විට අපි ඔවුන්ට ක්‍රිස්තුස් වහන්සේව හදුන්වා දිය යුතුය.

## වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනගක් සූදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම වේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
**පෙරමග දූතයා**
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

**මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47 දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.**